# 2021

## වාර්ෂික කාර්ය සාධන වාර්තාව
## வருடாந்த செயலாற்றுகை அறிக்கை
## ANNUAL PERFORMANCE REPORT




**දේශීය ආදායම් දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකාව**

**உள்நாட்டு இறைவரித் திணைக்களம் - இலங்கை**

**INLAND REVENUE DEPARTMENT - SRI LANKA**

# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

# වාර්ෂික
# කාර්ය සාධන වාර්තාව
# 2021

**වැය ශීර්ෂ අංකය 246**

(2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.4 වගන්තිය ප්‍රකාරව)

**එච්. එම්. ඩබ්. සී. බණ්ඩාර**
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

## ප්‍රධාන නිලධාරීන්

| | |
|---|---|
| **එච්.එම්.ඩබ්.සී. බණ්ඩාර මහතා** | **දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්** |

### නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරුන්

| | |
|---|---|
| **ඩී.ආර්.එස්. හපුආරච්චි මහතා** | බදු ප්‍රතිපත්ති, නීති සම්පාදන සහ ජාත්‍යන්තර සබඳතා |
| **එම්.එල්. මොහොමඩ් තාහීර් මහතා** | බදු පරිපාලනය - ඉහළ සංස්ථාපිත, තොරතුරු |
| **කේ.ඩී.එම්.එන්. ගුණතුංග මහතා** | බදු පරිපාලනය - විශාල බදු, ආදායම් අධීක්ෂණය, ආපසු ගෙවීම්, විමර්ෂණ හා බුද්ධි |
| **එස්.එස්.ඩී. වීරසේකර මහතා** | පාරිභෝගික සේවා සහ ප්‍රවර්ධන |
| **ටී. රාජපක්ෂ මහතා** | අභියාචනා සහ විරෝධතා, ණය කළමනාකරණය, හිඟ බදු අය කර ගැනීම හා නීති සබඳතා |
| **එම්.එස්.එම් සියාන් මහතා** | බදු පරිපාලන - ඉහළ සංස්ථාපිත හා ප්‍රභව බදු |
| **එම්.ඩී.ජේ.එම්. දේවප්‍රිය මහතා** | බදු පරිපාලන - මධ්‍ය සංස්ථාපිත, කුඩා පරිමාණ සංස්ථාපිත, අවදානම් කළමනාකරණය |
| **ආර්.ඒ.එන් රාජපක්ෂ මහතා (වැඩ බලන)** | බදු පරිපාලනය - විශාල බදු, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පරිපාලනය සහ ගෙවීම් පාලන |
| **එම්. ගුණවීර මහතා (වැඩ බලන)** | මානව ප්‍රාග්ධන මානව සම්පත් සහ වත්කම් කළමනාකරණය |

## ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරුන්

| | |
|---|---|
| ඩී.යූ.ඒ ජයවර්ධන මහතා | විශාල බදු පරිපාලනය/ ආපසු ගෙවීම් |
| ඩබ්.ඒ.එස්. චන්ද්‍රසේකර මිය | මානව සම්පත් සංවර්ධන හා වෙනස්වීම් කළමනාකරණය |
| එස්.එම් මොහොමඩ් මිෆ්ලි මහතා | බදු ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සබඳතා හා ලේකම් අංශය |
| එස්.එම්. අබේකෝන් බණ්ඩාර මහතා (වැඩ බලන) | මධ්‍ය පරිමාණ සංස්ථාපිත අංශ 1-8 |
| එල්.එම්.සී. වීරකෝන් මිය (වැඩ බලන) | පාරිභෝගික සේවා සහ ප්‍රවර්ධනය |
| ආර්.කේ.සී. චිත්‍රලතා මිය (වැඩ බලන) | විමර්ශන සහ බුද්ධි |
| ටී.එම්.ජේ.එන්. බණ්ඩාර මහතා (වැඩ බලන) | මිළ පැවරුම්, පර්යේෂණ, ජාත්‍යන්තර අංශය, ඉහල සංස්ථාපිත අංශ 4 සහ 7 |
| එච්.ඩබ්.එන්. තල්අරඹ මිය (වැඩ බලන) | විශාල බදු ගෙවන්නන්ගේ අංශය / බැංකු අංශය |
| එච්.එම්.සී.එම්. හේරත් මිය (වැඩ බලන) | මානව සම්පත් කළමනාකරණය |
| එම්.පී. එස්. අබේරත්න මහතා (වැඩ බලන) | ඉහල සංස්ථාපිත අංශ 3 සහ 6 |
| එම්. ගනේෂරාජා මහතා (වැඩ බලන) | ඉහල සංස්ථාපිත අංශ 1,2 සහ 5 |
| ආර්.පී.එච්. ප්‍රනාන්දු මිය (වැඩ බලන) | අභියාචනා සහ විරෝධතා (LTU, UCU, MCU, RO) |
| බී.කේ.එස්. සාන්ත මහතා (වැඩ බලන) | ස්වාධීන අභ්‍යන්තර කාර්යයන් පාලනය |
| එම්.ඩී. ආනන්දසිරි මහතා (වැඩ බලන) | තොරතුරු තාක්ෂණ පරිපාලනය හා ගෙවීම් පාලනය |
| එස්.පී. රණසිංහ මිය (වැඩ බලන) | තොරතුරු සහ අතුරු මුහුණත් නියෝජ්‍යායතන සහ විශේෂ කාර්යය |
| ජේ.ඒ.ඩී.ඩබ්.කේ. සිරිවර්ධන මිය (වැඩ බලන) | පාරිභෝගික ලියාපදිංචිය සහ යාවත්කාලීන කිරීම |
| යූ.ඩී.එන්. ජයවීර මහතා (වැඩ බලන) | කලාප I, II සහ III |
| ජේ.ඩී. රණසිංහ මිය (වැඩ බලන) | පැරණි පද්ධති, නීති කටයුතු සහ හිඟ බදු රැස් කිරීම |
| එන්.ටී.ඒ. දිසානායක මිය (වැඩ බලන) | විශාල බදු ගෙවන්නන්ගේ අංශය 4,5 සහ 6 |
| ඩී.එම්.එන්.එස්.බී. දිසානායක මහතා (වැඩ බලන) | රඳවා ගැනීමේ බදු, උපයන විට ගෙවීම, මුද්දර ගාස්තු, ඔට්ටු හා සූදු බදු (සරල කරන ලද එකතු කල අගය මත බදු) |
| වී.කේ.ඒ. තුසිතාංජලී මිය (වැඩ බලන) | ඉහල සංස්ථාපිත අංශය 8 සහ 9 |
| ටී.යූ. අතුකෝරල මහතා (වැඩ බලන) | ප්‍රසම්පාදනය, වත්කම් කළමනාකරණය සහ බදු මෙහෙයුම් සහාය |

## පටුන


| | | |
|---|---|---|
| වගු ලේඛනය | | vi |
| සටහන් ලේඛනය | | vii |
| කෙටි යෙදුම් | | viii |
| **01 වන පරිච්ඡේදය** | **ආයතනමය පැතිකඩ** | 1 |
| 1.1 | හැඳින්වීම | 3 |
| 1.2 | දැක්ම, මෙහෙවර සහ උපාය මාර්ගික ඉලක්ක | 4 |
| 1.3 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් | 5 |
| 1.4 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශයන් | 5 |
| 1.5 | සංවිධාන සටහන | 6 |
| **02 වන පරිච්ඡේදය** | **ප්‍රගතිය සහ අනාගත දැක්ම** | 7 |
| 2.1 | 2021 වර්ෂය තුල දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ විශේෂිත ජයග්‍රහණයන් | 9 |
| 2.1.1 | වර්ෂය තුල දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය කරනු ලැබූ බදු | 9 |
| 2.1.2 | මුළු ආදායම රැස් කිරීම | 10 |
| 2.1.3 | රජයේ ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය | 12 |
| 2.1.4 | මුද්දර බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ආදායම් පලාත් සභා වෙත මාරු කිරීම | 14 |
| 2.1.5 | ආදායම් බදු එකතු කිරීම | 14 |
| 2.1.6 | එකතු කල අගය මත බදු එකතු කිරීම | 15 |
| 2.1.7 | විගණනය | 16 |
| 2.1.8 | අභියාචනා | 17 |
| 2.1.9 | බදු ගෙවන්නන් ලියාපදිංචි කිරීමේ විස්තර | 18 |
| 2.1.10 | ඵලදායිතා අනුපාතය | 19 |
| 2.1.11 | බදු ගෙවන මහජනතාව සහ බදු වෘත්තිකයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 20 |
| 2.1.12 | වාර්තා අනුකූලතාවය | 22 |
| 2.1.13 | 2021 වර්ෂයේ ආදායම් බදු සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම් | 22 |
| 2.1.14 | වර්ෂය තුල පැනවූ නීති සම්පාදනයන් | 28 |
| 2.1.15 | වර්ෂය තුල නිකුත් කල ගැසට් නිවේදන | 28 |
| 2.2 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අභියෝග සහ අනාගත ඉලක්ක | 29 |
| 2.2.1 | අභියෝග | 29 |
| 2.2.2 | අනාගත ඉලක්ක | 30 |
| **03 වන පරිච්ඡේදය** | **වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය** | 31 |
| 3.1 | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | 33 |
| 3.2 | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 35 |
| 3.3 | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 36 |
| 3.4 | මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන් | 38 |

| | | |
|---|---|---|
| 3.5 | ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය | 53 |
| 3.6 | වෙන් කිරීම් ප්‍රයෝජනයට ගැනීමේ කාර්ය සාධනය | 55 |
| 3.7 | මු.රෙ. 208 ප්‍රකාරව අනෙකුත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවේ වැය සඳහා වන වෙන්කිරීම් ප්‍රදාන | 55 |
| 3.8 | මූල්‍ය - නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය | 55 |
| 3.9 | විගණකාධිපති වාර්තාව | 56 |
| **04 වන පරිච්ඡේදය** | **කාර්ය සාධන දර්ශක** | 57 |
| 4.1 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන දර්ශක | 59 |
| **05 වන පරිච්ඡේදය** | **තිරසාර සංවර්ධන ඉලක්ක** | 61 |
| 5.1 | තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීමේ කාර්ය සාධනය **(SDG)** | 63 |
| **06 වන පරිච්ඡේදය** | **මානව සම්පත් පැතිකඩ** | 65 |
| 6.1 | කාර්ය මණ්ඩල කළමනාකරණය | 67 |
| 6.2 | මානව සම්පත් සංවර්ධනය | 69 |
| **07 වන පරිච්ඡේදය** | **අනුකූලතා වාර්තාව** | 71 |
| 7.1 | අනුකූලතා වාර්තාව | 73 |
| ඇමුණුම | | |

# වගු ලේඛනය


| | | |
|---|---|---|
| වගුව 2:1 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරන ලද බදු | 9 |
| වගුව 2:2 | අවලංගු කර හෝ අහෝසි කර ඇති නමුත් 2021 වර්ෂයේ දී ආදායම් රැස් කිරීම් සිදු කරන ලද බදු | 9 |
| වගුව 2:3 | මුළු ආදායම රැස් කිරීම 2021 | 10 |
| වගුව 2:4 | ආදායම් රැස් කිරීම සැසඳීම - 2021 සහ 2020 | 11 |
| වගුව 2:5 | රාජ්‍ය ආදායමට සහ දළ දේශීය නිෂ්පාදිතයට (පවත්නා මිල ගණන් යටතේ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය | 13 |
| වගුව 2:6 | බදු ආදායම් රැස් කිරීම් පළාත් සභාවලට මාරු කිරීම - 2021 | 14 |
| වගුව 2:7 | සංස්ථාපිත හා සංස්ථාපිත නොවන ආදායම් බදු එකතු කිරීම | 14 |
| වගුව 2:8 | එකතු කල අගය මත බදු දල එකතු කිරීම් හා ආපසු ගෙවීම් | 15 |
| වගුව 2:9 | දල දේශීය නිශ්පාදිතයට එකතු කල අගය මත බද්දෙහි දායකත්වය අංශ වලට අදාලව විශ්ලේෂණය කිරීම | 16 |
| වගුව 2:10 | විගණන විස්තර | 17 |
| වගුව 2:11 | සංස්ථාපිත සහ වෙනත් අංශ මගින් රැස් කරන ලද අතිරේක බදු වර්ගීකරණය (දණ්ඩන හැර) | 17 |
| වගුව 2:12 | ලැබුනු හා නිරවුල් කල අභියාචනා විස්තර විශ්ලේෂණය | 17 |
| වගුව 2:13 | ලියාපදිංචි බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව | 18 |
| වගුව 2:14 | ආදායම් රැස් කිරීම, මුළු වියදම හා රැස් කිරීමේ පිරිවැය (රුපියල් මිලියන) | 19 |
| වගුව 2:15 | 2021 වර්ෂයේදී ජනතාව සඳහා පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩසටහන් | 20 |
| වගුව 2:16 | 2016/2017 සිට 2020/2021 දක්වා ආදායම් බදු වාර්තා අනුකූලතාවය | 22 |
| වගුව 2:17 | එකතු කළ අගය මත බදු වාර්තා අනුකූලතාවය | 22 |
| වගුව 2:18 | 2021 වර්ෂය තුලදී ප්‍රකාශයට පත් කරන ලද ගැසට් නිවේදන | 29 |
| වගුව 4:1 | 2021 වර්ෂයේ කාර්ය සාධන දර්ශක | 60 |
| වගුව 5:1 | තිරසාර සංවර්ධන ඉලක්ක පදනම් කර ගත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් | 63 |
| වගුව 6:1 | 2021.12.31 දිනට කාර්ය මණ්ඩලය | 67 |
| වගුව 6:2 | 2021.12.31 දිනට කාර්ය මණ්ඩල සාරාංශය | 68 |
| වගුව 6:3 | 2021 වර්ෂයේ දී පවත්වන ලද මානව සම්පත් සංවර්ධන වැඩසටහන් | 69 |

## සටහන් ලේඛනය


| | | |
|---|---|---|
| සටහන 2:1 | මුළු ආදායම රැස් කිරීම - 2021 | 11 |
| සටහන 2:2 | ආදායම් රැස් කිරීම සැසඳීම - 2021 සහ 2020 | 12 |
| සටහන 2:3 | රජයේ ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය | 13 |
| සටහන 2:4 | සංස්ථාපිත හා සංස්ථාපිත නොවන ආදායම් බදු එකතු කිරීම 2021 සහ 2020 | 15 |
| සටහන 2:5 | දල දේශීය නිශ්පාදිතයට එකතු කල අගය මත බද්දෙහි දායකත්වය අංශ වලට අදාලව විශ්ලේෂණය කිරීම | 16 |

## කෙටි යෙදුම්

| | |
|---|---|
| ආ.බ. | ආදායම් බදු |
| ප්‍රා.ලා.බ | ප්‍රාග්ධන ලාභ බද්ද |
| එ.අ.බ. | එකතු කළ අගය මත බද්ද |
| ස්.හෙ.බ | ස්වෙච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද |
| ණ.ආ.බ. | ණය ආපසු ගෙවීමේ බද්ද |
| ඔ.සූ.බ. | ඔට්ටු හා සූදු බද්ද |
| කො.ග.බ. | කොටස් ගනුදෙනු බද්ද |
| ප්‍රේ.බ | ප්‍රේෂණ බද්ද |
| ප්‍රේ.ගා | ප්‍රේෂණ ගාස්තු |
| මු.බ. | මුද්දර බද්ද |
| ජා.ගො.බ | ජාතිය ගොඩනැගීමේ බද්ද |
| ආ.සේ.ගා. | ආර්ථික සේවා ගාස්තු |
| භා.සේ.බ. | භාණ්ඩ හා සේවා බද්ද |
| පි.බ. | පිරිවැටුම් බද්ද |
| ජා.ආ.බ. | ජාතික ආරක්ෂණ බද්ද |
| ඉ.ක.බ. | ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද |
| උ.වි.ගෙ. | උපයන විට ගෙවීම් |
| හ.ආ.බ. | හවුල් ව්‍යාපාර ආදායම් බද්ද |
| ර.ගැ.බ. | රඳවා ගැනීමේ බද්ද |
| අ.පු.ආ.බ. | අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද |
| අ.ආ.බ. | අත්තිකාරම් ආදායම් බද්ද |
| දේ.ආ.දෙ | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව |
| ද.දේ.නි | දළ දේශීය නිෂ්පාදිතය |

# 1 වන පරිච්ඡේදය

## ආයතනමය

## පැතිකඩ

## 1.1 හැඳින්වීම

1932 වර්ෂයේ දී හඳුන්වා දෙන ලද ආදායම් බදු ක්‍රියාත්මක කිරීම සඳහා එම වර්ෂයේ දී ආදායම් බදු දෙපාර්තමේන්තුව නමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදී. ප්‍රතිපත්තිමය වෙනස්වීම් කිහිපයකින් අනතුරුව ආදායම් බදු දෙපාර්තමේන්තුව 1958 වර්ෂයේ දී දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වශයෙන් නම් කරන ලදී. හක්ස්හැම් මහතා ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ප්‍රථම කොමසාරිස්වරයා වූ අතර ප්‍රථම ප්‍රාදේශීය කාර්යාලය 1963 වර්ෂයේ දී යාපනයේ ස්ථාපනය කරන ලදී. වර්තමානය වන විට ප්‍රාදේශීය කාර්යාල සංඛ්‍යාව පහළොව දක්වා ඉහළ ගොස් ඇති අතර එමඟින් බදු වර්ග පහකට වඩා පරිපාලනය කරනු ලබයි. පසුගිය වසර ගණනාවක කාලය තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සංඛ්‍යාත්මකව මෙන් ම ප්‍රමාණාත්මකව වර්ධනය වෙමින් දිවයිනෙහි ප්‍රධාන පෙළේ බදු රැස්කිරීමේ ආයතනයක් බවට පත් විය. 1974 වර්ෂයේ දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කරන ලද අතර දේශීය ආදායම් සේවය සංවෘත සේවාවක් වශයෙන් ස්ථාපනය කරන ලදී. එමෙන් ම 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත ප්‍රවර්තන වර්ෂයේ බදු පදනමට අනුගතව පනවන ලදී. පසුව 2006 අංක 10 දරන නව ආදායම් බදු පනත පනවන ලද අතර මෙම පනත යටතේ ආර්ථික සේවා ගාස්තු පනවන ලදී. අවසන් වශයෙන් 2018 වර්ෂයේ දී 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත හඳුන්වා දෙන ලදී.

ශ්‍රී ලංකාව තුළ සෑම බදු ගෙවන්නෙකු විසින් ම තමා විසින් ගෙවිය යුතු බද්ද තක්සේරු කර බදු නීති රීති ප්‍රකාරව ස්වයං තක්සේරු ක්‍රමය යටතේ ගෙවීම් සිදු කල යුතුය. ආදායම් බද්ද, එකතු කළ අගය මත බද්ද (VAT), ආර්ථික සේවා ගාස්තු (ESC), ජාතිය ගොඩනැඟීමේ බද්ද (NBT), ඔට්ටු සහ සූදු බද්ද, මුද්දර බද්ද, කොටස් ගනුදෙනු බද්ද, ප්‍රේෂණ ගාස්තු සහ ස්වෙච්ඡාවෙන් හෙළිදරව් කිරීම් මත බද්ද හා සම්බන්ධ ආදායම් බදු රැස්කිරීම සඳහා බදු පරිපාලකවරු 1,007 ක් සහ ඒකාබද්ධ සේවයේ නිලධාරීහු 1,474 ක් සේවයේ යෙදී සිටිති. බදු පදනම ඉහළ නැංවීමේ අරමුණින් ප්‍රථම බදු සමාව 1964 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලදී.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව 2021 වර්ෂයේ දී රුපියල් මිලියන 632,831 ක බදු රැස්කරමින් රාජ්‍ය අදායම ශක්තිමත් කළ අතර එය පූර්ව වර්ෂයේ බදු රැස්කිරීම සමඟ සසඳා බැලූ විට 20.78% ක වර්ධනයකි. එමඟින් රජයේ සමස්ත ආදායමට 43.43% ක දායකත්වයක් සලසන ලද අතර එය දළ දේශීය නිෂ්පාදිතය සඳහා 3.76% ක දායකත්වයකි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මහජනතාව සහ වෙනත් ආයතන සඳහා RAMIS පද්ධතිය මඟින් මාර්ගගතව ඵලදායී සේවයක් සපයන ලදී. දිවයින තුළ පැවති කොවිඩ් -19 වසංගත තත්ත්වය හමුවේ මහජනතාව වෙත අඛණ්ඩ සේවයක් සැපයීමට එමඟින් මහඟු පිටිවහලක් වූ බව සඳහන් කළ යුතුය.

## 1.2 දැක්ම, මෙහෙවර සහ උපාය මාර්ගික ඉලක්ක

### දැක්ම

මනා පුහුණුවක් සහ කැපවීමක් සහිත කාර්ය මණ්ඩලයකින් යුතුව බදු ගෙවන ජනතාව උදෙසා මා හැඟි සේවයක් ඉටු කරන්නා වූ, බදු ගෙවන්නා කෙරෙහි බදු හිතෛෂී බදු පරිපාලකයෙක් බවට පත්වීම

### මෙහෙවර

බදු ගෙවීම කෙරෙහි ස්වේච්ඡා අනුකූලතාව දිරි ගැන්වීම මගින් මෙන්ම බදු ගෙවීම පැහැර හැරීම හා මග හැරීම වළක්වාලීම මගින් අදාළ බදු නීති හා අනෙකුත් අණ පනත් වලට යටත්ව බදු අය කිරීම

බදු හා ආශ්‍රිත ව්‍යවස්ථාවන් සාධාරණව, එක සමානව, ආචාරශීලීව ක්‍රියාවට නැංවීම මගින් බදු ක්‍රමයේ අවංකභාවය හා කාර්යක්ෂමතාව කෙරෙහි මහජන විශ්වාසය පවත්වාගෙන යාමට කටයුතු කිරීම

### උපාය මාර්ගික ඉලක්ක

ස්වේච්ඡාවෙන් බදු ගෙවීම කෙරෙහි අනුකූලතාවය දැක්වීම සඳහා බදු ගෙවන්නන් දිරි ගන්වන අතරම, ඊට අනුබල සැලසෙන වැඩසටහන් ඔස්සේ බදු නීතිරීති කෙරෙහි ඔවුන් ස්වේච්ඡාවෙන් එකඟ කරවා ගැනීම, වැඩි දියුණු කිරීම හා එසේ අනුකූලතාවය නොදක්වන්නන් සොයා දැන අදාළ අවස්ථාවන්හිදී ඔවුනට එරෙහිව සුදුසු කටයුතු කිරීම

වැඩ කිරීමේ කාර්යක්ෂම ක්‍රම හා තාක්ෂණය යොදා ගැනීම මගින් සහ දැනට තිබෙන සම්පත් වඩා හොඳින් උපයෝගී කර ගැනීම තුළින් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම

දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පෙරදැරි කරගෙන වඩාත් ඵලදායී අයුරින් දායක වීමට හැකිවනු පිණිස කළමනාකරණ හා තාක්ෂණික පුහුණුව මෙන්ම සේවා පළපුරුද්ද තුළින් කාර්ය මණ්ඩලයේ ඵලදායීතාවය සහ වෘත්තීයමය බව ඉහළ නැංවීම

## 1.3 දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්

- දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ විෂය පථය යටතේ වන්නා වූ සියළු අණ පනත් පරිපාලනය කිරීම
- රාජ්‍ය බදු ආදායම රැස් කිරීම
- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳව ප්‍රතිචාර ලබා දීම

## 1.4 දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- පාරිභෝගික සේවා හා ප්‍රවර්ධන අංශය
- විශාල සංස්ථාපිත අනුකූලතා හා විගණන අංශය
- ඉහළ සංස්ථාපිත අනුකූලතා හා විගණන අංශය
- මධ්‍ය සංස්ථාපිත අනුකූලතා හා විගණන අංශය
- සංස්ථාපිත නොවන අනුකූලතා හා විගණන අංශය
- මෙට්‍රො සහ ප්‍රාදේශීය අංශය
- අභියාචනා අංශය
- ආපසු ගෙවීම් අංශය
- හිඟ බදු අය කර ගැනීමේ අංශය
- ලේකම් අංශය
- ප්‍රභව  බදු අංශය
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පරිපාලන අංශය
- වංචා වැළැක්වීමේ අංශය
- මානව සම්පත් හා වත්කම් පරිපාලන අංශය
- මූල්‍ය අංශය
- ආදායම් පරිපාලන හා කළමනාකරණ තොරතුරු පද්ධති ව්‍යාපෘති අංශය

## 1.5 සංවිධාන සටහන

**ආයතනික ව්‍යුහය - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව 2021.12.31 දිනට**



# 2 වන පරිච්ඡේදය

## ප්‍රගතිය සහ අනාගත දැක්ම

## 2.1 2021 වර්ෂය තුල දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ විශේෂිත ජයග්‍රහණයන්

### 2.1.1 වර්ෂය තුලදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය කරනු ලැබූ බදු

වර්ෂය තුලදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරන ලද අණ පනත් අනුව පනවන ලද බදු පහත 2.1 වන වගුවේ දැක්වේ.

**2.1 වගුව: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරන ලද බදු**

| බද්ද | අදාළ අණ පනත් |
|---|---|
| ආදායම් බද්ද | 2021 අංක 10 දරන පනත මගින් සංශෝධනය කළ පරිදි 2017 අංක 24 දරන දේශීය අදායම් පනත |
| එකතු කළ අගය මත බදු (මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද ඇතුළත්ව) | 2003 අංක 07, 2004 අංක 13, 2005 අංක 06, 2006 අංක 08, 2007 අංක 14, 2008 අංක 15, 2009 අංක 15, 2011 අංක 09, 2012 අංක 7, 2013 අංක 17, 2014 අංක 7, 2015 අංක 11, 2016 අංක 20, 2018 අංක 25 සහ 2019 අංක 19 දරන පනත්වලින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනත |
| ඔට්ටු හා සූදු බදු | 2015 අංක 14 දරන පනත මගින් සංශෝධිත 1988 අංක 40 දරන ඔට්ටු හා සූදු බදු පනත |
| මුද්දර ගාස්තු | 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත සහ 2008 අංක10 සහ 2011 අංක13 දරන පනත් මගින් සංශෝධිත 2006 අංක12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත |
| කොටස් ගනුදෙනු බද්ද | 2005 අංක 05 දරන මුදල් පනත සහ 2007 අංක13 දරන මුදල් පනත |
| විගමන බද්ද | 2015 අංක 10 දරන මුදල් පනත |
| ප්‍රේෂණ ගාස්තු | 2017 අංක 12 දරන විදේශ විනිමය පනත |
| ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද | 2021 අංක 18 දරන මුදල් පනත |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

කලින් බලාත්මකව තිබූ දැනට අවලංගු කර හෝ අහෝසි කර ඇති පහත සඳහන් බදු සම්බන්ධයෙන් අය කාර්යයන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

**2.2 වගුව : අවලංගු කර හෝ අහෝසි කර ඇති නමුත් 2021 වර්ෂයේදී ආදායම් රැස් කිරීම් සිදු කරන ලද බදු**

| බද්ද | අදාළ ප්‍රඥප්තිය |
|---|---|
| ජාතිය රැක ගැනීමේ දායක බද්ද | 1991 අංක 52දරන ජාතිය රැක ගැනීමේ දායක බදු පනත, සංශෝධිත පරිදි |
| භාණ්ඩ හා සේවා බද්ද | 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත, සංශෝධිත පරිදි |

| | |
|---|---|
| පිරිවැටුම් බද්ද (උතුරු පළාත) | 1981 අංක 69 දරන පිරිවැටුම් පනත, සංශෝධිත පරිදි |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 2005 අංක 5 දරන මුදල් පනත, සංශෝධිත පරිදි |
| වාහන හිමිකම් බද්ද | 2015 අංක 10 දරන මුදල් පනත |
| ආර්ථික සේවා ගාස්තුව | 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත, සංශෝධිත පරිදි |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත, සංශෝධිත පරිදි |
| ණය ආපසු ගෙවීමේ බද්ද | 2018 අංක 35 දරන මුදල් පනත් |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.2 මුළු ආදායම රැස් කිරීම

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂය තුළ දී රු. 632,830,585,186/- ක ශුද්ධ ආදායම් ප්‍රමාණයක් රැස් කර ඇත. (ඊට පළාත් සභාවලට මුළුමනින්ම මාරු කරනු ලබන මුද්දර බද්ද සහ පළාත් සභාවලට මාරු කරනු ලබන ජාතිය ගොඩනැගීමේ බද්ද යන රැස්කිරීම් වලින් 1/3 ක කොටස ද ඇතුළත් වේ.)

වර්ෂය සඳහා මුළු ආදායම් රැස්කිරීම රුපියල් මිලියන 632,831 ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව රුපියල් මිලියන 108,897/- ක වැඩිවීමක් පෙන්නුම් කරයි. පසුගිය වර්ෂය තුල කොවිඩ් -19 වසංගත තත්වය කලින් කලට පැන නැගුණ ද දේශීය ආදායම් දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය සමග සම්බන්ධ වී තම නිවසේ සිට රාජකාරි කරමින් මෙකී සාර්ථකත්වය අත්කර ගැනීමට උත්සුක වූහ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සාර්ථකත්වය සඳහා බදු අනුකූලතාවය බලාත්මක කිරීමට ගත් පුළුල් ක්‍රියාමාර්ග හේතු වූ අතර ආදායම් පරිපාලන කළමණාකරන තොරතුරු පද්ධතිය ඒ සඳහා දායක විය.

රජයේ ආදායමට වර්ෂය තුළදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව දැරූ දායකත්වයෙහි ප්‍රතිශතය 43.43% කි. අනුරූපී ඇස්තමේන්තු සමඟ එක් එක් බදු වර්ගය යටතේ වන ආදායම සසඳා බැලූ විට, ආදායමේ මුළු රැස්කිරීම, 103.30% ක අගයක් පෙන්වන අතර ශුද්ධ ආදායම (පළාත් සභාවලට සම්පූර්ණයෙන්ම මාරු කරන ලද මුද්දර ගාස්තු සහ පළාත් සභාවලට මාරු කරන ලද ජාතිය ගොඩනැගීමේ බද්දෙන් 1/3 ක් හැර) වසර සඳහා ඇස්තමේන්තුවෙන් 101.16% ක් විය

**2.3 වගුව : මුළු ආදායම රැස්කිරීම - 2021**

| බදු වර්ගය | ආදායම් ඇස්තමේන්තුව (රු.) | ආදායම් රැස් කිරීම (රු.) | රැස්කිරීම ඇස්තමේන්තුවේ % ක් ලෙස | රැස්කිරීම් මුළු ආදායමට %ක් ලෙස |
|---|---|---|---|---|
| ආදායම් බද්ද | 293,000,000,000 | 300,544,591,273 | 102.57% | 47.49% |
| ප්‍රාග්ධන ලාභ බද්ද | 500,000,000 | 667,876,234 | 133.58% | 0.11% |
| එකතු කල අගය මත බද්ද | 310,000,000,000 | 308,213,044,594 | 99.42% | 48.70% |

| බදු වර්ගය | ආදායම් ඇස්තමේන්තුව (රු.) | ආදායම් රැස් කිරීම (රු.) | රැස්කිරීම ඇස්තමේන්තුවේ % ක් ලෙස | රැස්කිරීම් මුළු ආදායමට %ක් ලෙස |
|---|---|---|---|---|
| ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද | 500,000,000 | 174,616,959 | 34.92% | 0.03% |
| ණය ආපසු ගෙවීමේ බද්ද | - | 7,565,402 | - | 0.00% |
| ඔට්ටු හා සූදු බද්ද | 2,200,000,000 | 1,939,352,796 | 88.15% | 0.31% |
| කොටස් ගණුදෙනු බද්ද | 5,100,000,000 | 6,964,477,149 | 136.56% | 1.10% |
| විගමන බද්ද | 13,500,000 | 17,032,375 | 126.17% | 0.00% |
| මුද්දර බද්ද | - | 12,949,837,858 | - | 2.05% |
| ආර්ථික සේවා ගාස්තු | 1,000,000,000 | 728,114,581 | 72.81% | 0.12% |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 300,000,000 | 599,129,474 | 199.71% | 0.09% |
| භාණ්ඩ හා සේවා බද්ද | - | 244,534 | - | 0.00% |
| පිරිවැටුම් බද්ද | - | 18,742,858 | - | 0.00% |
| ජාතික ආරක්ෂක බද්ද | - | 322,006 | - | 0.00% |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | - | 422,144 | - | 0.00% |
| ප්‍රේෂණ ගාස්තු | 1,000,000 | 5,214,948 | 521.49% | 0.00% |
| **මුළු ආදායම් රැස් කිරීම** | **612,614,500,000** | **632,830,585,186** | **103.30%** | **100.00%** |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

සටහන 2.1 මුළු ආදායම රැස් කිරීම - 2021




මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**2.4 වගුව : ආදායම් රැස් කිරීම සැසඳීම - 2021 සහ 2020**

| බදු වර්ගය | 2021 ආදායම් රැස්කිරීම් (රු.) | 2020 ආදායම් රැස්කිරීම් (රු.) | රැස්කිරීමේ අඩුවීම හෝ වැඩිවීම ( %) ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| ආදායම් බද්ද | 300,544,591,273 | 252,941,572,901 | 18.82% |

| බදු වර්ගය | **2021**<br>ආදායම් රැස්කිරීම්<br>(රු.) | **2020**<br>ආදායම් රැස්කිරීම්<br>(රු.) | රැස්කිරීමේ අඩුවීම හෝ වැඩිවීම ( %) ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| ප්‍රාග්ධන ලාභ බද්ද | 667,876,234 | 357,594,125 | 86.77% |
| එකතු කළ අගය මත බද්ද | 308,213,044,594 | 233,786,120,184 | 31.84% |
| ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද | 174,616,959 | - | - |
| ණය ආපසු ගෙවීමේ බද්ද | 7,565,402 | 3,002,271,834 | -99.75% |
| ඔට්ටු හා සූදු බද්ද | 1,939,352,796 | 1,428,071,291 | 35.80% |
| කොටස් ගණුදෙනු බද්ද | 6,964,477,149 | 2,347,277,681 | 196.70% |
| විගමන බද්ද | 17,032,375 | 5,853,185 | 190.99% |
| මුද්දර බද්ද | 12,949,837,858 | 11,354,837,819 | 14.05% |
| ආර්ථික සේවා ගාස්තු | 728,114,581 | 14,950,042,437 | -95.13% |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 599,129,474 | 3,740,463,661 | -83.98% |
| භාණ්ඩ හා සේවා බද්ද | 244,534 | 226,221 | 8.09% |
| පිරිවැටුම් බද්ද | 18,742,858 | 16,257,541 | 15.29% |
| ජාතික ආරක්ෂක බද්ද | 322,006 | 2,399,368 | -86.58% |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 422,144 | 636,657 | -33.69% |
| ප්‍රේෂණ බද්ද | 5,214,948 | - | |
| **මුළු ආදායම් රැස් කිරීම** | **632,830,585,186** | **523,933,624,905** | **20.78%** |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**සටහන 2.2 ආදායම් රැස් කිරීම සැසඳීම 2021 -සහ 2020**




මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.3 රජයේ ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය

2021 වසරේ රජයේ ආදායමට සහ දළ දේශීය නිෂ්පාදිතයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය මෙන්ම පසුගිය වසර හතරක කාලය තුළ එහි ප්‍රවණතාවයන් *2.5* වන වගුවෙන් පෙන්වන අතර, එම දායකත්වය 2.3 වන සටහනින් නිරූපණය කෙරේ. 2021 වසරේ රජයේ මුළු ආදායම රුපියල් මිලියන

1,457,071 ක් වූ අතර එයින් 43.43% ක ප්‍රතිශතාත්මක දායකත්වයක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇත..

දළ දේශීය නිෂ්පාදිතයට දේශීය ආදායම් දෙපාර්තමේන්තු ආදායම් රැස්කිරීමේ අගය ප්‍රතිශතයක් ලෙස ගත් විට 2021 වර්ෂය සඳහා 3.76% ක් වේ.

**2.5 වගුව : රාජ්‍ය ආදායමට සහ දළ දේශීය නිෂ්පාදිතයට (පවත්නා මිල ගණන් යටතේ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය**

| වර්ෂය | රජයේ ආදායම (රු. මිලියන) | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රැස් කිරීම (රු. මිලියන) | රජයේ ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රැස්කිරීමේ ප්‍රතිශතය | පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය (රු. මිලියන) | දළ දේශීය නිෂ්පාදිතයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 2017 | 1,831,531 | 836,518 | 45.67% | 13,328,103 | 6.28% |
| 2018 | 1,919,973 | 900,348 | 46.89% | 14,290,907 | 6.30% |
| 2019 | 1,890,899 | 1,025,319 | 54.22% | 14,997,157 | 6.84% |
| 2020 | 1,367,960 | 523,934 | 38.30% | 15,027,374 | 3.49% |
| 2021 | 1,457,071 | 632,831 | 43.43% | 16,809,309 | 3.76% |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

**සටහන 2.3 : රජයේ ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය**




මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.4 මුද්දර බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ආදායම් පළාත් සභාවලට මාරුකිරීම

2011 අයවැය යෝජනාවලට අනුකූලව පනවා ඇති අදාළ ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට කරන ලද සංශෝධන ප්‍රකාරව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් රැස් කරනු ලබන පහත සඳහන් බදු, දක්වා ඇති ප්‍රතිශතයන්ගෙන් පළාත් සභා වලට මාරුකරන ලදී.

ජාතිය ගොඩනැගීමේ බදු -මුළු එකතුවෙන් 33.33%

මුද්දර ගාස්තුව-මුළු එකතුවෙන් 100.00%

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අදාළ බදුවල මුළු රැස් කිරීම් ප්‍රමාණය සහ පළාත් සභාවලට මාරු කරන ලද මුදල 2.6 වන වගුවෙහි දැක්වේ.

**2.6 වගුව : බදු ආදායම් රැස් කිරීම් පළාත් සභාවලට මාරු කිරීම - 2021**

| | මුළු රැස්කිරීම් (රු.) | පළාත් සභාවලට මාරු කල ප්‍රමාණය (රු.) | % |
|---|---|---|---|
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 599,129,474 | 165,395,220 | 33.33% |
| මුද්දර බද්ද | 12,949,837,858 | 12,949,837,858 | 100% |

මූලාශ්‍රය :දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.5 ආදායම් බදු එකතු කිරීම

එකතු කළ මුළු ආදායම් බදු වලින් 84% ක් එනම් රුපියල් බිලියන 251,831 ක ප්‍රමාණයක් සඳහා දායකත්වය සපයා තිබුනේ සංස්ථාපිත අංශයයි. සංස්ථාපිත නොවන අංශය රුපියල් බිලියන 48,714 ක ප්‍රමාණයක් එනම් 16% ක දායකත්වයක් සපයා තිබුණි.

එහි සංයුතිය 2.7 වන වගුවේ පෙන්වා දී ඇති අතර 2.4 වන සටහන මගින් එය පැහැදිලි කරයි.

**2.7 වගුව : සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු එකතු කිරීම**

| | 2021 | | 2020 | |
|---|---|---|---|---|
| | බදු එකතු කිරීම (රු.) | % | බදු එකතු කිරීම (රු.) | % |
| සංස්ථාපිත | 251,830,847,280 | 84% | 214,461,197,787 | 85% |
| සංස්ථාපිත නොවන | 48,713,743,993 | 16% | 38,480,375,113 | 15% |
| **එකතුව** | **300,544,591,273** | **100%** | **252,941,572,901** | **100%** |

*2021 දී රු.මි. 483 ක් හා 2020 දී රු.මි.4,311 ක් වූ ලාභාංශ බද්ද ඇතුළුව

**උපයන විට ගෙවීම (උ.වි.ගෙ) යෝජනා ක්‍රමය යටතේ සේවා නියුක්තිකයින් විසින් ගෙවූ ර.ගැ.බ. සහ ආදායම් බදු ඇතුළුව

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**සටහන 2.4 : සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු එකතු කිරීම 2021 සහ 2020**




මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.6 එකතු කළ අගය මත බදු එකතු කිරීම

පෙර වර්ෂයේ රු.මිලියන 223,786 ක් වූ එකතු කළ අගය මත බදු එකතු කිරීම්, පසුගිය වර්ෂයේ 31.84% කින් එනම් රු.මිලියන 74,427 කින් ඉහළ ගොස් තිබේ. කෙසේ නමුදු වර්ෂය සඳහා වන ඇස්තමේන්තුව වූ රු.මිලියන 310,000 සමග සැසඳූ කළ වර්ෂය සඳහා ආදායමේ රු. මිලියන 1,787 ක සුළු වෙනසක් දක්නට ලැබේ. වාර්තා හා ගෙවීම් සමීපව අධීක්ෂණය කිරීමත්, ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය යටතේ පරිපාලනයත් එ.අ.බ. ආදායම ඉහල නැංවීමට හේතු විය. ආනයන මත එ.අ.බ. සැසඳීමේදී දේශීය සැපයුම් මත එකතු කළ එ.අ.බ. රුපියල් මිලියන 63 ක වැඩිවීමක් පෙන්විය. වර්ෂය සඳහා එකතු කල මුළු දේශීය එ.අ.බ. රුපියල් මිලියන 185,462 ක් වූ අතර එය 2020 වසරේ වූ රුපියල් මිලියන 37,401 ට සාපේක්ෂව 25.26% ක වැඩවීමකි. 2021 වර්ෂය තුළ ආනයන මත එකතු කල එ.අ.බ. පෙර වර්ෂයට සාපේක්ෂව 43%ක වැඩිවීමක් පෙන්විය.

එ.අ.බ. දළ එකතු කිරීම, ආපසු ගෙවීම් සහ ශුද්ධ එකතු කිරීම් 2.8 වන වගුව මගින් අංශවලට අදාළව දක්වා ඇත.

**2.8 වගුව : එකතු කළ අගය මත බදු දළ එකතු කිරීම සහ ආපසු ගෙවීම්**

| අංශය | 2021 | | | 2020 | |
|---|---|---|---|---|---|
| | මුළු රැස් කිරීම (රු.) | ආපසු ගෙවීම් | ශුද්ධ රැස් කිරීම (රු.) | ශුද්ධ රැස් කිරීම (රු.) | |
| නිෂ්පාදන | 40,091,354,658 | 455,962,894 | 39,635,391,763 | | 42,508,495,632 |
| නිෂ්පාදන නොවන | | | | | |
| සේවා | 78,509,090,905 | | 78,509,090,905 | 63,100,659,321 | |
| මූල්‍ය සේවා | 67,317,686,840 | | 67,317,686,840 | 42,451,850,831 | 105,552,510,152 |
| ආනයන | 122,765,927,289 | 15,052,205 | 122,750,875,084 | | 85,725,114,398 |
| එකතුව | | | **308,213,044,594** | | **233,786,120,183** |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

ආංශික වශයෙන් එකතු කල අගය මත බදු ශුද්ධ රැස් කිරීම් හා එකතු කල අගය මත බද්ද දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2.9 වගුවේ දක්වා ඇති අතර එය 2.5 සටහන මගින් නිරූපණය කෙරේ.

**2.9 වගුව: දළ දේශීය නිෂ්පාදිතයට එකතු කළ අගය මත බද්දෙහි දායකත්වය අංශවලට අදාළව විශ්ලේෂණය කිරීම.**

| අංශය | 2021 | | 2020 | | දළ දේශීය නිෂ්පාදිතයට එ.අ.බ. එකතු කිරීමේ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|
| | ශුද්ධ එකතු කිරීම ( රු. ) | % | ශුද්ධ එකතු කිරීම ( රු. ) | % | 2021 | 2020 |
| නිෂ්පාදන අංශය | 39,635,391,764 | 12.86% | 42,508,495,632 | 18.18% | 0.57% | 0.55% |
| නිෂ්පාදන නොවන අංශය | 145,826,777,746 | 47.31% | 105,552,510,153 | 45.15% | 1.49% | 1.40% |
| ආනයන මත | 122,750,875,084 | 39.83% | 85,725,114,398 | 36.67% | 1.25% | 1.24% |
| **එකතුව** | **308,213,044,594** | **100.00%** | **233,786,120,184** | **100.00%** | **3.31%** | **3.19%** |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**සටහන 2.5 ද.දේ.නි. ට එකතු කළ අගය මත බද්දෙහි දායකත්වය අංශවලට අදාළව විශ්ලේෂණය කිරීම**




මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.7 විගණනය

ව්‍යාපාර ක්‍රියාකාරකම්, අස්ථිත්වයේ වර්ගය සහ ව්‍යාපාරයේ ප්‍රමාණය ප්‍රකාරව බදු ගෙවන්නන්ගේ ගහනය පුළුල් ලෙස ආවරණය වන පරිදි විගණනය සහ විමර්ශනය 2021 වසර තුළදී සිදු කරන ලදී.

**2.10** වගුව : විගණන විස්තර

රු. '000

| | ආදායම් බදු | එ.අ.බ. | ආ.සේ.බ. | ජා.ගො.බ. | එකතුව |
|---|---|---|---|---|---|
| වර්ෂය තුල තක්සේරු කළ අතිරේක බදු වල මුළු ප්‍රමාණය | 1,317,556 | 20,518,058 | 26 | 73 | 21,835,713 |
| වර්ෂය තුළ එකතු කළ අතිරේක බදුවල මුළු ප්‍රමාණය | 1,214,937 | 125,124 | - | - | 1,367,061 |
| වර්ෂය තුළ ආරම්භ කළ විගණන පරීක්ෂණ සංඛ්‍යාව | 4,862 | | | | |
| වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද විගණන පරීක්ෂණ සංඛ්‍යාව | 1,477 | | | | |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**2.11 වගුව: සංස්ථාපිත සහ වෙනත් අංශ මගින් රැස් කරන ලද අතිරේක බදු වර්ගීකරණය කිරීම (දණ්ඩන හැර)**

| විස්තරය | තක්සේරු නිකුත් කල සහ එකඟ වූ අතිරේක ආදායම/පිරිවැටුම (රු'000) | තක්සේරු නිකුත් කල සහ එකඟ වූ අතිරේක බදු (රු'000) | | | | එකතු කල අතිරේක බදු (රු.'000) |
|---|---|---|---|---|---|---|
| | | සංස්ථාපිත මහා පරිමාණ බදු ගෙවන්නන් ගේ අංශය | සංස්ථාපික වෙනත් | වෙනත් අංශ | එකතුව | |
| ආදායම් බදු | 14,048,640 | 433,009 | 879,984 | 4,562 | 1,317,556 | 1,214,937 |
| එ.අ.බ. | 21,065,890 | 20,476,274 | 23,517 | 18,267 | 20,518,058 | 152,124* |
| ආ.සේ.භා | 2,656 | 26 | - | - | 26 | - |
| ජා.ගො.බ. | 3,672 | - | 73 | - | 73 | - |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

*එ.අ.බ. යටතේ එකතු කල අතිරේක බදු තුල 2021.12.31 දින දක්වා රැස් කල ප්‍රමාණය ඇතුලත් වේ.

### 2.1.8 අභියාචනා

ගත වූ වර්ෂය තුළ නිකුත් කළ තක්සේරු වලට එදිරිව ලැබී ඇති අභියාචනා 836 ක් අවසන් කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමත් වූ අතර අභියාචනා විශ්ලේෂණය පහත පරිදි වේ.

**2.12** වගුව : ලැබුණු සහ නිරවුල් කළ අභියාචනා විශ්ලේෂණය

| | ආදායම් බදු | එ.අ.බ. | උ.වි.ගෙ | ආ.සේ.ගා. | ජා.ගො.බ. | ර.ගැ.බ. | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **2021.01.01** දිනට ශේෂය | 287 | 342 | 1 | 11 | 265 | 2 | 621 |
| වර්ෂය තුල ලියාපදිංචි වීම (APL 2 ප්‍රකාරව) | 224 | 386 | 3 | 3 | 234 | 0 | 836 |
| සමථයට පත් කළ | 143 | 269 | 2 | 0 | 136 | 1 | 739 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **2021.12.31** වන දිනට **ශේෂය** | 211 | 196 | 2 | 1 | 117 | 0 | 213 |
| **කොමසාරිස් ජනරාල්වරයාගේ කරුණු විමසීම සඳහා ඉදිරිපත් කල** | 157 | 263 | 0 | 13 | 246 | 1 | 505 |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.9 බදු ගෙවන්නන් ලියාපදිංචි කිරීමේ විස්තර

2021 වර්ෂය අවසන් වන විට විවිධාකාර බදුකරණ කාර්යයන් සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග ලියාපදිංචි වී ඇති තැනැත්තන් සංඛ්‍යාව 2.13 වන වගුවේ දක්වා ඇත.

**2.13 වගුව : ලියාපදිංචි වී ඇති බදු ගෙවන්නන් සංඛ්‍යාව**

| | **2021.12.31** | | **2020.12.31** | |
|---|---|---|---|---|
| **සංස්ථාපිත** | | | | |
| වාසික සමාගම්/නිර්වාසික සමාගම්/පුද්ගල මණ්ඩල | 68,009 | | 60,721 | |
| **සංස්ථාපිත නොවන** | | | | |
| තනි පුද්ගල | 292,305 | | 292,712 | |
| හවුල් ව්‍යාපාර | 16,798 | | 16,949 | |
| උපයන විට ගෙවීම (උ.වි.ගෙ.)/අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (අ.ආ.බ.) යෝජනා ක්‍රමය යටතේ ආදායම් බදු ගෙවන සේවා නියුක්තිකයින් | 32,702 | | 209,800* | |
| **ආදායම් බදු ගෙවන්නන්ගේ එකතුව** | | **409,814** | | **580,182** |
| **වෙනත් බදු ගෙවන්නන්** | | | | |
| එකතු කළ අගය මත බදු (එ.අ.බ.) සඳහා ලියාපදිංචි වී ඇති තැනැත්තන් | 9,070 | | 8,152 | |
| මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වී ඇති තැනැත්තන් | 246 | | 239 | |
| ඔට්ටු සහ සූදු බදු ගෙවන්නන් සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 660 | | 637 | |
| වෙනත් බදු ගෙවන්නන්ගේ එකතුව | | **9,976** | | **9,028** |
| උ.වි.ගෙ./අ.ආ.බ. යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි වී ඇති සේවා යෝජකයින් | 34,985 | | 34,991 | |
| පොලිය මත රඳවාගැනීමේ බද්ද/ අ.ආ.බ. සඳහා ලියාපදිංචි වී ඇති රඳවාගැනීමේ බදු/අත්තිකාරම් ආදායම් බදු අනුයෝජිතයින් | 604 | | 615 | |
| විශේෂිත ගාස්තු මත රඳවාගැනීමේ බදු/අ.ආ.බ. (විධිමත් මාසික උපලේඛනයන් යවන්නන්) | 41,862 | | 43,188 | |
| මුද්දර ගාස්තු (විධිමත් මාසික උපලේඛනයන් යවන්නන්) | 9,854 | | 9,609 | |
| | | **87,305** | | **88,403** |
| **2021.12.31 වන දිනට ලියාපදිංචි වී ඇති මුළු බදු ගෙවන්නන් සංඛ්‍යාව** | | **507,095** | | **677,613** |

*31.12.2020 දිනට උ.වි.ගෙ යටතේ ආදායම් බදු ගෙවන ලද පුද්ගලයින් සංඛ්‍යාව වෙනස් කර ඇත.

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.10 ඵලදායීතා අනුපාතය

2021 වර්ෂය තුල දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මුළු වියදම රු. මිලියන 4,577 ක් වන අතර රැස් කළ ආදායම රු.මිලියන 632,831 ක් වේ. එහෙයින් ඵලදායීතා අනුපාතය (එනම් වියදම් කළ සෑම රුපියලක් සඳහාම එකතු කළ ආදායම) 138: 1 ක් වේ. නැතහොත්, රුපියල් 100/= ක් එකතු කිරීමට වැය වන පිරිවැය ශත 72 කි. ආනයන මත එ.අ.බ. , ජා.ගො.බ. සහ ආ.සේ.ගා. බැහැර කර රුපියල් 100/= ක් එකතු කිරීමට වැය වන පිරිවැය ශත 90 කි. (වර්ෂ 2020 දී මෙම අගයන් පිළිවෙලින් ශත 86 ක් සහ රු.1.03 ක් විය.)

වර්ෂ 2019 සිට 2021 දක්වා ආදායම් එකතු කිරීමේ වර්ගීකරණය, මුළු වියදම සහ එකතු කිරීමේ පිරිවැය 2.14 වගුව මගින් පෙන්වා දෙයි.

**2.14 වගුව: ආදායම් රැස් කිරීම, මුළු වියදම සහ රැස් කිරීමේ පිරිවැය (රු. මිලියන)**

| විස්තරය | 2019 | 2020 | 2021 |
|---|---|---|---|
| **ආදායම එකතු කිරීම** | | | |
| ආදායම් බද්ද | 371,795.68 | 252,941.57 | 300,544.59 |
| ප්‍රාග්ධන ලාභ බද්ද | 602.44 | 357.59 | 667.88 |
| එකතු කළ අගය මත බද්ද | 443,877.13 | 233,786.12 | 308,213.04 |
| ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද | - | - | 174.62 |
| ණය ආපසු ගෙවීමේ බද්ද | 28,673.57 | 3,002.27 | 7.57 |
| ඔට්ටු හා සූදු බද්ද | 2,435.98 | 1,428.07 | 1,939.35 |
| කොටස් ගණුදෙනු බද්ද | 1,023.44 | 2,347.28 | 6,964.48 |
| විගමන බද්ද | 5.01 | 5.85 | 17.03 |
| මුද්දර ගාස්තු | 14,863.02 | 11,354.84 | 12,949.84 |
| ආර්ථික සේවා ගාස්තු | 55,301,40 | 14,950.04 | 728.11 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 105,185.80 | 3,740.46 | 599.13 |
| භාණ්ඩ හා සේවා බද්ද | 17.04 | 0.23 | 0.24 |
| පිරිවැටුම් බද්ද | 29.63 | 16.26 | 18.74 |
| ජාතික ආරක්ෂක බද්ද | 9.05 | 2.40 | 0.32 |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 1.22 | 0.64 | 0.42 |
| වාහන හිමිකම් බද්ද | 1,498.60 | - | - |
| ප්‍රේෂණ ගාස්තු | - | - | 5.21 |
| **මුළු එකතු කිරීම** | **1,025,319.01** | **523,933.62** | **632,830.59** |
| **වියදම** | | | |
| **පුනරාවර්ථන වියදම** | | | |
| පඩිනඩි | 2,712.91 | 2,736.63 | 2,707.27 |
| ගමන් වියදම් | 22.55 | 7.09 | 2.62 |
| සැපයුම් හා උපකරණ | 170.84 | 121.00 | 136.34 |
| නඩත්තු හා අළුත්වැඩියා | 142.41 | 158.78 | 183.54 |
| කොන්ත්‍රාත් සේවා | 720.17 | 593.20 | 584.13 |
| මාරුකිරීම් | 43.85 | 44.76 | 33.58 |
| වෙනත් (පාඩු හා කපාහැරීම්) | - | 0.22 | - |
| **ප්‍රාග්ධන වියදම** | | | |
| ප්‍රතිසංස්කරණ හා වැඩි දියුණු කිරීම | 114.85 | 139.77 | 38.73 |
| අත්පත් කර ගැනීම | 144.55 | 65.01 | 50.62 |
| ධාරිතා ගොඩනැංවීම | 42.80 | 19.74 | 17.01 |

| | | | |
|---|---|---|---|
| ආයෝජන ( RAMIS ව්‍යාපෘතිය) | 364.27 | 227.60 | 823.16 |
| ආයෝජන (නව දේශීය ආදායම් පනත) | 55.93 | 375.92 | - |
| **මුළු වියදම** | **4,535.13** | **4,489.72** | **4,577.00** |
| **රු.100 ක් රැස් කිරීම සඳහා පිරිවැය** | **0.44** | **0.86** | **0.72** |
| **රු.100 ක් රැස් කිරීම සඳහා පිරිවැය (ආනයන මත එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු, ආර්ථීක සේවා ගාස්තු හැර)** | **0.54** | **1.03** | **0.90** |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.11 බදු ගෙවන මහ ජනතාව සහ බදු වෘත්තිකයන් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම

2021 වර්ෂය තුළ බදු ගෙවන්නන් සහ බදු වෘත්තිකයින් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලදි. මෙම වැඩ සටහන්වලදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු වූයේ බදු නීතියේ වෙනස්වීම් පිළිබඳව සහ විද්‍යුත් සේවාව හරහා බදු වාර්තා ගොනු කිරීම සම්බන්ධයෙන් දැනුම ලබාදීමයි.

**2. 15 වගුව: 2021වර්ෂයේදී ජනතාව සඳහා පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩසටහන්**

| අංකය | විෂය | ආයතනය | සහභාගී වූ පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | තනි පුද්ගල ආදායම් බදු | විදුලි සංදේශ ඉංජිනේරු සංගමය | 450 |
| 2 | අ.පු.ආ.බ. /උ.වි.ගෙ. | ලංකා විදුලි බල මණ්ඩලය | 800 |
| 3 | සංස්ථාපිත ආදායම් බදු | බදු ගෙවන්නන්/විගණන සමාගම්/ බදු උපදේශකවරුන් සහ විෂය පිළිබඳ උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන් | Microsoft Teams හරහා දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වන ලදි. පටිගත කර දේශීය ආදායම් You Tube Channel වෙත උඩුගත කෙරුණු අතර අදාළ සම්බන්ධතාවයන් පාරිභෝගිකයින් වෙත විද්‍යුත් තැපැල හරහා යැවීමට කටයුතු කෙරුණි. මෙම වැඩ සටහන් දෙපාර්තමේන්තු |
| 4 | ර.ගැ.බ./අ.ආ.බ. 20/21 | | |
| 5 | අ.පු.ආ.බ./උ.වි.ගෙ. 20/21 | | |
| 6 | ගෙවිය යුතු ඇස්තමේන්තුගත ආදායම් බදු ප්‍රකාශය -21/22 (සිංහල මාධ්‍යය) | | |
| 7 | ගෙවිය යුතු ඇස්තමේන්තුගත ආදායම් බදු ප්‍රකාශය - 21/22 (ඉංග්‍රීසි මාධ්‍යය) | | |
| 8 | ආදායම් බදු/සංස්ථාපිත ආදායම් බදු වාර්තා - 20/21 (සිංහල මාධ්‍යය) | | |
| 9 | ආදායම් බදු/සංස්ථාපිත ආදායම් බදු වාර්තා - 20/21 (දෙමළ මාධ්‍යය) | | |
| 10 | ආදායම් බදු/තනි පුද්ගල ආදායම් බදු වාර්තා - 20/21 (සිංහල මාධ්‍යය) | | |
| 11 | ආදායම් බදු/තනි පුද්ගල ආදායම් බදු වාර්තා - 20/21 (ඉංග්‍රීසි මාධ්‍යය) | | |
| 12 | ආදායම් බදු/තනි පුද්ගල ආදායම් බදු වාර්තා - 20/21 (දෙමළ මාධ්‍යය) | | |

| | | | |
|---|---|---|---|
| 13 | ආදායම් බදු/හවුල් ව්‍යාපාර බදු වාර්තා - 20/21 (සිංහල මාධ්‍යය) | | මුහුණු පොතේ සහ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇත. |
| 14 | ආදායම් බදු/හවුල් ව්‍යාපාර බදු වාර්තා - 20/21 (ඉංග්‍රීසි මාධ්‍යය) | | |
| 15 | ආදායම් බදු/හවුල් ව්‍යාපාර බදු වාර්තා - 20/21 (දෙමළ මාධ්‍යය) | | |
| 16 | සංස්ථාපිත ආදායම් බදු 20/21 විද්‍යුත් - ගොනු කිරීම (e-filling) (සිංහල මාධ්‍යය) | | |
| 17 | සංස්ථාපිත ආදායම් බදු 20/21 විද්‍යුත් - ගොනු කිරීම (ඉංග්‍රීසි මාධ්‍යය) | | |
| 18 | තනි පුද්ගල ආදායම් බදු 20/21 විද්‍යුත් - ගොනු කිරීම (සිංහල මාධ්‍යය) | | |
| 19 | තනි පුද්ගල ආදායම් බදු 20/21 විද්‍යුත් - ගොනු කිරීම (ඉංග්‍රීසි මාධ්‍යය) | | |
| 20 | හවුල් ව්‍යාපාර ආදායම් බදු 20/21 විද්‍යුත් - ගොනු කිරීම (සිංහල මාධ්‍යය) | | |
| 21 | හවුල් ව්‍යාපාර ආදායම් බදු 20/21 විද්‍යුත් - ගොනු කිරීම (ඉංග්‍රීසි මාධ්‍යය) | | |
| 22 | ඇස්තමේන්තුගත ආදායම් බදු 20/21 විද්‍යුත් - ගොනු කිරීම **RAMIS** ඇමතුම් මධ්‍යස්ථානය | **RAMIS** ඇමතුම් මධ්‍යස්ථානය සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 150 |
| 23 | මූලික ආදායම් බදු රෙගුලාසි | **BSC** කාර්ය මණ්ඩල පුහුණු | 600 |
| 24 | ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම් මත බදු (සිංහල මාධ්‍යය) | බදු ගෙවන්නන්/විගණන සමාගම්/ බදු උපදේශකවරුන් සහ විෂය පිළිබඳ උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන් | Microsoft Teams හරහා දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වන ලදි. පටිගත කර දේශීය ආදායම් You Tube Channel වෙත උඩුගත කෙරුණු අතර අදාළ සම්බන්ධතාවයන් පාරිභෝගිකයින් වෙත විද්‍යුත් තැපැල හරහා යැවීමට කටයුතු කෙරුණි. මෙම වැඩ සටහන් දෙපාර්තමේන්තු මුහුණු පොතේ සහ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇත. |
| 25 | ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම් මත බදු (ඉංග්‍රීසි මාධ්‍යය) | | |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.12 වාර්තා අනුකූලතාවය

බදු ගෙවන්නා විසින් නියමිත වේලාවට බදු වාර්තා පිරවීම සහ ස්වයං තක්සේරු පදනම මත බදු ගෙවීම් අනුකූලතාවය ඉහල නැංවීම සඳහා වර්ෂය මුළුල්ලේ වැඩ සටහන් අඛණ්ඩව පැවැත්වුණි.

**2.16 වගුව: 2016/2017 – 2020/2021 ආදායම් බදු වාර්තා අනුකූලතාවය**

| තක්සේරු වර්ෂය | අංශය | නියමිත දිනට අනුකූලතාවය | නියමිත දින සිට එක් මාසයක් තුල අනුකූලතාවය |
|---|---|---|---|
| 2016/2017 | සංස්ථාපිත | 41% | 45% |
| | සංස්ථාපිත නොවන | 45% | 56% |
| 2017/2018 | සංස්ථාපිත | 47% | 51% |
| | සංස්ථාපිත නොවන | 31% | 38% |
| 2018/2019 | සංස්ථාපිත | 47% | 50% |
| | සංස්ථාපිත නොවන | 32% | 38% |
| 2019/2020 | සංස්ථාපිත | 6% | 8% |
| | සංස්ථාපිත නොවන | 3% | 6% |
| 2020/2021 | සංස්ථාපිත | 12% | 26% |
| | සංස්ථාපිත නොවන | 6% | 20% |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**2.17 වගුව: එකතු කල අගය මත බදු වාර්තා අනුකූලතාවය**

| වර්ෂය | අනුකූලතාවය |
|---|---|
| 2019 වර්ෂය | 47% |
| 2020 වර්ෂය | 36% |
| 2021 වර්ෂය | 47% |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

කොවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් සංස්ථාපිත ආදායම් බදු වාර්තා, තනි පුද්ගල ආදායම් බදු වාර්තා සහ හවුල් ව්‍යාපාර ආදායම් බදු වාර්තා භාරදීමේ දිනය 2021 දෙසැම්බර් 31 වන දින දක්වා දීර්ඝ කරන ලදී. එහෙයින් සංස්ථාපිත ආදායම් බදු වාර්තා, තනි පුද්ගල ආදායම් බදු වාර්තා සහ හවුල් ව්‍යාපාර ආදායම් බදු වාර්තා භාරදීමේ නියමිත දිනට භාරදීමේ අනුකූලතාවයෙහි සැලකිය යුතු අඩුවීමක් ඇත. කෙසේ නමුදු සංස්ථාපිත අංශයට හා සංස්ථාපිත නොවන අංශයට සහන කාලයක් ලබා දීමෙන් පසු පිලිවෙළින් 46% ක සහ 30% ක අනුකූලතා අනුප්‍රමාණයක් පෙන්වීය.

### 2.1.13 2021 වර්ෂයේ ආදායම් බදු සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්

#### *2.1.13.1 ආදායම් බදු මත සිදු කළ ප්‍රතිපත්තිමය වෙනස්කම්*

**1. අලෙවිකරණ සහ සන්නිවේදන වියදම්**

ආදායම උත්පාදනය කිරීමේදී යම් තැනැත්තෙකුට අලෙවිකරණ සහ සන්නිවේදන වියදම් උද්ගත වන්නේ නම්, ඒවා ප්‍රාග්ධනය වුවද නොවුවද ආදායම ගණනය කිරීමේදී අඩුකළ යුතු අතර 2021 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි තක්සේරු වර්ෂ තුනක් සඳහා 100% ක අතිරේක අඩු කිරීමක් සිදු කළ හැක.

**2. ඉලෙක්ට්‍රොනික බදු පද්ධතිය යොදා ගැනීම**

2021 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි බදු වාර්තා ඊ සේවාව හරහා සම්පූර්ණ කිරීම සමාගම් සහ රාජ්‍ය සංස්ථාවලට අනිවාර්යය වේ.

**3. ගිණුම් සහ සටහන්**

විවිධාකාර සංස්ථාපිත බදු අනුප්‍රමාණ හඳුන්වා දී ඇති හෙයින් 2021 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි බදු අය කළ හැකි ආදායමේ සෑම කොටසකටම එක් එක් ආදායම් බදු අනුප්‍රමාණ යොදා ගනිමින් ලැබීම් සහ ලාභවලින් බදු අය කළ හැකි ආදායම වෙනම හඳුනාගැනීමට හෝ නිදහස් කළ ලැබීම් සහ ලාභ හඳුනා ගැනීමට වෙන වෙනම මූල්‍ය ප්‍රකාශ නඩත්තු කල යුතුය.

**4. බදු වාර්තා**

අනුමත ගණකාධිවරයෙකු ගෙවීමක් මත යම් තැනැත්තෙකුගේ ආදායම් වාර්තාව සකස් කළේ නම්, ඔහු විසින් පරීක්ෂා කල ලිපිලේඛන විශේෂයෙන් සඳහන් කර ආදායම් වාර්තාව සමග සහතිකයක් භාරදීම 2021 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කළ යුතුය.

**5. වංචනික ලෙස සකසන ලද හෝ සහතික කරන ලද ලිපි ලේඛන සඳහා දණ්ඩන විධිවිධාන**

2021 අප්‍රේල් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි යම් තොරතුරක ලිපිලේඛන වංචනික ලෙස සකස් කිරීම හෝ වංචනිකව ලිපිලේඛන සහතික කිරීම යම් තැනැත්තෙකු විසින් සිදු කලේ නම්, මහේස්ත්‍රාත් අධිකරණයක ලඝු නඩු විභාගයක් පැවැත්වීමෙන් අනතුරුව වැරදිකරු වුවහොත් රුපියල් මිලියනය නොඉක්මවන දඩයකකට හෝ සය මාසයක් නොඉක්මවන බන්ධනාගාර ගත කිරීමකට යටත් කල හැකිය.

**6. බදු අනුප්‍රමාණ**

***(i)*** 2022 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඕනෑම පුද්ගලයෙකු මැණික් හා ස්වර්ණාභරණ සම්බන්ධයෙන් ලැබූ ප්‍රතිෂ්ඨාව සඳහා සහ පුනර්ජනනීය බලශක්ති ප්‍රභව යොදා ගනිමින් ජාතික විදුලිබල පද්ධතියට විදුලිය සැපයීම සම්බන්ධයෙන් ලැබුණු මුදල් ප්‍රමාණ සම්බන්ධයෙන් 18% ක් වූ ප්‍රගමන අනුප්‍රමාණය, උපරිමය 14% දක්වා අඩු කර තිබේ.

***(ii)*** 2021 ජනවාරි 01 වන දිනට හෝ එදිනට පසු එනමුදු 2021 දෙසැම්බර් 31 ට පෙර, තම කොටස් කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත කර ඇති ආයෝජන මණ්ඩල සංගම් ඇතුළු ඕනෑම සමාගමක් සඳහා 2021 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ආයෝජක වත්කම් උපලබ්ධි වීම මගින් වන ලැබීම් හැර, සමුච්චිත ආදායම් බදු 50%කින් අඩු කළ යුතුය.

***(iii)*** ඕනෑම බහුජාතික සමාගමක ලාභාංශ මගින් වන ලැබීම් සහ ලාභ මත ගෙවිය යුතු ආදායම් බද්ද, 2021 අප්‍රේල් 01 වන දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා 25% කින් පහල දැමෙන අතර එකී තක්සේරු

වර්ෂයෙන් ඉන් ඉක්බිති තක්සේරු වර්ෂ දෙක සඳහා අපනයන ඉහළ යාමට යටත්ව (විශේෂිත ව්‍යාපාරයක් හැර) 50% කින් ද පූර්ව තක්සේරු වර්ෂයට හෝ අපනයන ඉහළ යාමට සාපේක්ෂව;

අ) 2021 අප්‍රේල් 01 වන දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා 30% කින් ද

ආ) 2022 අප්‍රේල් 01 වන දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා 50% කින් ද

පහළ දැමේ.

***(iv)*** කෘෂි පිරිසැකසුම් හෝ කෘෂි නිෂ්පාදන සමග කෘෂි ගොවිපොළවල් පවත්වාගෙන යනු ලබන ඕනෑම තැනැත්තෙකු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද එකී තක්සේරු වර්ෂයේ සිට තක්සේරු වර්ෂ 5 ක් දක්වා, 2021 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ගෙවිය යුතු මුළු බදු ප්‍රමාණයෙන් 25% කින් පහළ දැමේ.

**7. ආයෝජන දිරි දීමනා**

***(i)*** බදු ඉඩම් පිළිබඳ වැඩි දියුණු කිරීම්

යම් තැනැත්තෙකු විසින් ආයෝජනයක් ලෙස බදු ඉඩමක ස්ථිර ලෙස ඉදි කළ හෝ සාදන ලද ඕනෑම ගොඩනැගිල්ලක්, ව්‍යුහයක්, ඒ හා සමාන කටයුත්තක්, 2021 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අස්පෘශ්‍ය දේපළක් ලෙස නොසැළකිය යුතු අතර ක්ෂය වන දේපළක් ලෙස සැලකිය යුතුය.

***(ii)*** සේවා නියුක්තික ආදායම නිදහස් කිරීම

ශ්‍රී ලංකාවේ ක්ෂය විය හැකි වත්කම් (අස්පෘශ්‍ය වත්කම් හැර) මත ඇ.ඩො.250 කට වඩා ගෙවීම් සිදු කරන සමාගමක් නම් වැඩි කළ ප්‍රාග්ධන දීමනා මගින් ආරක්ෂාව සලසන ලද ලාභ මගින් ගෙවනු ලැබ ඇති කාලපරිච්ඡේදය සඳහා හෝ සලකනු ලබන කාලපරිච්ඡේදය සඳහා තම රටින් බැහැරව වසන සේවා නියුක්තිකයන්ගේ සංඛ්‍යාව 20 නොඉක්මවන්නේ නම් වර්ෂ පහක් සඳහා ද රටින් බැහැරව වසන සේවා නියුක්තිකයෙකුගේ සේවා නියුක්තික ආදායම මත යොදා ගනු ලබන බදු අනුපාතය ශූන්‍ය විය යුතුය.

**8. බදු නිදහස් කිරීම්**

***(i)*** තම සාමාජිකයන්ගේ හෝ තම පවුල්වල සුබසාධනය පිණිස ස්ථාපනය කර ඇති හෝ සැකසූ ඕනෑම සුබසාධක සංගමයක, දායක මුදල් යහසාධක අරමුදල් ඇතුළුව එහි සාමාජිකයින්ගෙන් සැපයෙන්නේ නම් 2021 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ආදායම් බද්දෙන් නිදහස් වේ.

***(ii)*** ඕනෑම දේශීය බැංකුවක විදේශ ව්‍යවහාර මුදලින් තැන්පතුවක් ආරම්භ කර පවත්වාගෙන යන රටවල් දෙකක හෝ ඊට වැඩි සංඛ්‍යාවක ව්‍යාපාර ආයතනයන් සහිත ආශ්‍රිත සමූහ සමාගමක්, තම ආනයන වියදම් ආවරණය කර ගැනීමට එකී තැන්පතුව පවත්වාගෙන යන්නේ නම්, 2021 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එකී තක්සේරු වර්ෂය සඳහා එකී තැන්පතුව ආදායම් බද්දෙන් නිදහස් වේ.

***(iii)*** ශ්‍රී ලංකා රජය විසින් හෝ වෙනුවෙන් නිකුත් කළ ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර උපලබ්ධිවීම මගින් වන ලැබීම් සහ එවැනි බැඳුම්කරවල ඇ.ඩො. මිලියන 100 කට නොඅඩුවන පරිදි සමුච්චිත

ආයෝජනයක් සිදු කළ වාණිජ බැංකුවක් හෝ බලයලත් ගණුදෙනුකරුවෙකුට ලැබුණු හෝ ඉපයූ ලැබීම්, 2021 අප්‍රේල් මස 01 වන දින හෝ එදිනෙන් පසු නිදහස්ය.

***(iv)*** ලියාපදිංචි කොටස් සහ සුරැකුම්පත් ආඥාපනත (420 අධිකාරය) යටතේ සුරැකුම්පත් හෝ භාණ්ඩාගාර බැඳුම්කර හෝ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත (417 අධිකාරය) යටතේ භාණ්ඩාගාර බිල්පත් මගින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත ඕනෑම සමෘද්ධි ප්‍රජා පාදක බැංකුවක් විසින් 2021 අප්‍රේල් මස 01 වන දින හෝ එදිනෙන් පසු උපචිත හෝ ඉපයූ පොලී හෝ වට්ටම්, 2021 අප්‍රේල් මස 01 වන දින දිට ක්‍රියාත්මක වන පරිදි ආදායම් බද්දෙන් නිදහස් වේ.

***(v)*** කොළඹ කොටස් වෙළඳ පොලේ ලැයිස්තුගත කර ඇති සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් බලපත්‍ර ලබා ඇති දේපල ආයෝජන භාරයක් මගින් ඒකක හිමිකරුවෙකු විසින් ව්‍යාපාරයක හෝ ආයෝජනයක ප්‍රාග්ධන වත්කම් උපලබ්ධිවීම මත ලැබූ ලාභාංශ සහ ලැබීම් 2021 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ආදායම් බද්දෙන් නිදහස් වේ.

***(vi)*** තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂම මගින් නියාමනය වන සහ තාක්ෂණ හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සංකල්පය ***(TVET*** සංකල්පය) යටතේ ප්‍රමිතගත කර ඇති ඕනෑම වෘත්තීය අධ්‍යාපන ආයතනයක ඕනෑම වෘත්තීය අධ්‍යාපන වැඩ සටහනක් මගින් තැනැත්තෙකු උපයාගත් හෝ ඉපයූ ලැබීම් සහ ලාභ

(අ) එකී ආයතනය සලකනු ලබන තක්සේරු වර්ෂයට ඉන් ඉක්බිතිව එළඹෙන තක්සේරු වර්ෂය සඳහා වෘත්තීය අධ්‍යාපන වැඩ සටහන් සඳහා සිසුන් බඳවා ගැනීම් එකී තක්සේරු වර්ෂයට සාපේක්ෂව දෙගුණ කර ඇත්නම් 2021 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ආදායම් බද්දෙන් නිදහස් වේ.

(ආ) එකී ආයතනය පළමු වර්ෂයේ වෘත්තීය අධ්‍යාපන වැඩසටහන් සඳහා බඳවාගත් සිසුන් ප්‍රමාණය දෙගුණ කර එවැනි වැඩ සටහන් සඳහා එම සිසුන් ප්‍රමාණයම ඊළඟ අවුරුදු හතර මුළුල්ලේම පවත්වාගෙන ගියේ නම් එකී වර්ෂ සඳහා අවශ්‍යතා සම්පූර්ණ කළ ආයතනයක් ලෙස සලකා 2021 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ආදායම් බද්දෙන් නිදහස් වේ.

***(vii)*** ඕනෑම මැණික් හෝ ස්වර්ණාභරණ අපනයන ව්‍යාපාරයක් හෝ ශ්‍රී ලංකාවට මැණික් රැගෙනවිත් කපා ඔප දමා එලෙස කපා ඔප දැමීමෙන් අනතුරුව අපනයනය කරන ව්‍යාපාරයක් මගින් උපයන ලැබීම් සහ ලාභ, ශ්‍රී ලංකාවේ බැංකුවක් හරහා විදේශ ව්‍යවහාර මුදලින් ප්‍රේෂණය කරන්නේ නම් 2021 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ආදායම් බද්දෙන් නිදහස් වේ.

***(viii) 2021*** අප්‍රේල් මස 01 වන දින ආරම්භ කළ පහත සඳහන් ඕනෑම නව ව්‍යාපාරයක් (දැනටමත් පවතින ව්‍යාපාරයක් කොටස් වලට වෙන් කරමින් හෝ නැවත ගොඩනගමින් සැකසූ ව්‍යාපාර නොවන) මගින් යම් තැනැත්තෙකු ලබන හෝ උපයන ලැබීම් සහ ලාභ (දේශීය ආදායම් පනතේ ***iv*** වන පරිච්ඡේදය යටතේ

ගණනය කරනු ලබන ව්‍යාපාරයක ප්‍රාග්ධන වත්කම් සහ බැරකම් උපලබ්ධිවීම මගින් වන ඕනෑම ලැබීමක් හැර) පහත දක්වා ඇති කොන්දේසිවලට යටත්ව එකී කාල සීමාව සඳහා ආදායම් බද්දෙන් නිදහස් වේ.

(අ) ඉදිකිරීම් කර්මාන්තශාලාවල දැනටමත් භාවිතා කර ඇති අමුද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමට, ශ්‍රී ලංකාව තුළ වෙනම තෝරාගත් වැඩබිමක ස්ථාපිත කර ඇති ප්‍රතිචක්‍රියකරණය කළ ඉදිකිරීම් අමුද්‍රව්‍ය විකිණීමේ නිරත වී සිටින ව්‍යාපාරයකට ( එක සමාන තත්වයන් සහිත වැඩබිමක් හරහා තමන් විසින්ම ප්‍රතිචක්‍රීකරණය කළ ඉදිකිරීම් අමුද්‍රව්‍ය භාවිතා කර ඉදිකිරීම් සේවා සපයන තැනැත්තෙකු, ඔහු විසින් එකී සේවා සැපයීමේදී ඉදිකිරීම් සේවා සඳහා එකී අමුද්‍රව්‍ය අලෙවි කල ඒවා සේ සලකා, එසේ අලෙවි කළ අවස්ථාවේ ඉදිකිරීම් සේවා සඳහා එකී අමුද්‍රව්‍ය වෙළඳපොළ මිල ගණන්වලට අලෙවි කර ඇති ලෙස සළකා) අවුරුදු දහයක කාලපරිච්ඡේදයක් සඳහා*;*

(ආ) තාක්ෂණ සහ වෘත්තීය අධ්‍යාපනය හා පුහුණු සංකල්පය යටතේ ප්‍රමිතිගත ***(TVET*** සංකල්පය) සහ තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂම මගින් නියාමනය වන ඕනෑම වෘත්තීය අධ්‍යාපන ආයතනයක් මගින් වෘත්තීය අධ්‍යාපනය සාර්ථක ලෙස සම්පූර්ණ කළ පුද්ගලයෙකු 2021 අප්‍රේල් 01 වන දින හෝ එදිනට පසුව ආරම්භ කළ ඕනෑම ව්‍යාපාරයක් සඳහා පස් අවුරුදු කාලපරිච්ඡේදයක් සඳහා*;*

(ඇ) වාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාවේ දී බෝට්ටු හෝ නැව් නිෂ්පාදනය කිරීමේ කාර්යය සඳහා ආරම්භ කල ව්‍යාපාරයක එවැනි බෝට්ටු හෝ නැව් සැපයීම මගින් යම් ලැබීම් හෝ ලාභ ලබා හෝ උපයා ඇත්නම් වසර හතක කාලපරිච්ඡේදයක් සඳහා*;*

(ඈ) මෙගා වොට් සියයකට නොඅඩු ධාරිතාවයකින් යුක්තව සූර්ය හෝ සුළං බලය යොදා ගෙන ස්ථාපිත කළ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියක එසේ නිපදවනු ලබන විදුලි බලය ජාතික විදුලිබල පද්ධතියට එකතු කරන්නේ නම් අවුරුදු හතක කාලපරිච්ඡේදයක් සඳහා*;*

(ඉ) වාසික තැනැත්තෙකු විසින් 2021 අප්‍රේල් මස 01 වන දින හෝ එදිනට පසුව සන්නිවේදන කුළුණු ඉදිකිරීම හා සවි කිරීම සහ ශ්‍රී ලංකාවේ දේශිය ශ්‍රමය සහ දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් ඒ හා සම්බන්ධ උපකරණ භාවිතයෙන් එවැනි ඉදිකිරීම් සහ සවිකිරීම් සඳහා අවැසි තාක්ෂණික සේවා සපයන වාසික තැනැත්තෙකු සඳහා පස් අවුරුදු කාල පරිච්ඡේදයක් සඳහා *;*

ඉහත උපඡේදවල (උපඡේද ***(vi)*** හැර) සපයා ඇති බදු නිදහස් කිරීමේ කාල සීමාවන් සලකනු ලබන්නේ එකී තක්සේරු වර්ෂයේ සිදුකරන ලද ගනුදෙනුවලින් ලාභ ඉපයීම (එවැනි ව්‍යාපාරයකින් තක්සේරු කළ හැකි ආදායම) ආරම්භ කරන තක්සේරු වර්ෂයේ සිට හෝ ව්‍යාපාරය වෙළඳ මෙහෙයුම් ආරම්භ කිරීම අරඹන දිනයේ සිට එකී ව්‍යාපාරය වර්ෂ දෙකක් සම්පූර්ණ කරන තක්සේරු වර්ෂයට ඉන් ඉක්බිතිව එළඹෙන තක්සේරු වර්ෂය සහ ඒවායින් පළමුව එළඹෙන තක්සේරු වර්ෂයේ සිටය.

*9.* **සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන**

2021 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පුද්ගලයෙකුගේ හෝ අස්ථිත්වයක් විසින් බදු අය කළ හැකි ආදායම වෙත එළඹීමේදී පහත සඳහන් සුදුසුකම් ලබන ගෙවීම් අඩු කල යුතුය*;*

***(i)*** සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර තහවුරු කළ පරිදි සමෘද්ධි ප්‍රතිලාභී පවුලක කාන්තාවක් සඳහා වෙළඳසැලක් පිහිටුවීම සඳහා නේවාසික පුද්ගලයෙකු විසින් මුදලක් හෝ වෙනත් යම් ආකාරයකින් ලබා දුන් දායකත්වය*;*

***(ii)*** ශ්‍රී ලංකා මහා බැංකුව විසින් තහවුරු කළ පරිදි සහ අවස්ථාවෝචිත පරිදි සලකා බැලූ සියළු තොරතුරු මගින් නිශ්චය වන පරිදි යමු මූල්‍ය ආයතනයක් විසින් වෙනත් මූල්‍ය ආයතනයක් අත්පත් කර ගැනීම හෝ ඒකාබද්ධ කිරීම සඳහා පිරිවැයක් ලෙස දරන ලද වියදමක් මේ සඳහා ඇතුලත් ය. එසේ අඩු කළ හැකි එකී වියදම එක හා සමාන කොටස්වලින් තක්සේරු වර්ෂ තුනක කාලපරිච්ඡේදයක් තුළ එකී වියදම දැරූ තක්සේරු වර්ෂයේ සිට ආරම්භ වන පරිදි එක් එක් තක්සේරු වර්ෂයේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කළ යුතුය.

කෙසේ නමුදු, වසරක් තුළ තක්සේරු කළ හැකි මුළු ආදායම ඉහත අවසර ලත් අඩු කිරීම් ඉක්මවා නොතිබීම හේතුවෙන්, එකී වසර තුනක කාලපරිච්ඡේදයක් තුළ අඩු කිරීමට නොහැකි වූ යම් මුදලක් එම වසර තුනක කාල පරිච්ඡේදයෙන් පසුව වහාම එළඹෙන තක්සේරු වර්ෂයේදී අඩු කළ යුතුය.

***(iii)*** 2021 අප්‍රේල් මස 01 වන දින හෝ එදිනට පසු යම් තැනැත්තෙකු විසින් -

(අ) රුපියල් මිලියන පහකට නොඅඩු පිරිවැයකින් යුතු චිත්‍රපටියක් නිෂ්පාදනය (එවැනි චිත්‍රපටියක ප්‍රවර්ධන වියදම ද ඇතුළුව) කිරීමේදී*;*

(ආ) රුපියල් මිලියන විසිපහ නොඉක්මවන පිරිවැයකින් නව සිනමා ශාලාවක් ඉදිකිරීමේදී සහ බඩු බාහිරාදිය සම්පාදනය කිරීමේදී*;*

(ඇ) රුපියල් මිලියන දහය නොඉක්මවන පිරිවැයකින් සිනමා ශාලාවක් සංවර්ධනය කිරීමේදී*;*

මෙම උපඡේදය යටතේ අඩුකිරීම් තක්සේරු වර්ෂයේ බදු අය කළ හැකි ආදායමෙන් තුනෙන් එකකට සීමා කළ යුතු අතර, ඉහත කාර්යයක් මත දරන ලද වියදම වර්තමාන වර්ෂයේ අඩු නොකලේ නම් සමාන සීමාවන් යටතේ ඉදිරියට ගෙන ගොස් ඊළගට එළඹෙන වර්ෂයේදී අඩු කළ හැක.

***(iv)*** තම පරිශ්‍රයේ සවි කිරීම සඳහා සූර්ය පැනල ලබාගෙන ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කළ වාසික පුද්ගලයෙකු සම්බන්ධයෙන් එක් එක් තක්සේරු වර්ෂය සඳහා රු.600,000/- ක් ලෙස, එකී සූර්ය පැනල

සඳහා වැය වූ මුළු වියදම දක්වා හෝ එවැනි සූර්ය පැනල ලබාගැනීම සඳහා ණය ලෙස බැංකු වලින් ලබා ගත් මුදල් ප්‍රමාණ දක්වා අඩු කල හැක.

**10. පරිපාලන සමාලෝචනය**

තක්සේරුවක පරිපාලන සමාලෝචන තීරණයක් මගින් අගතියට පත් වූ බදු ගෙවන්නෙකු විසින් කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය ලැබුණු දිනයේ සිට දින තිහක් ඇතුළත හෝ පරිපාලන සමාලෝචනය යටතේ පරිපාලන සමාලෝචනය සඳහා ඉල්ලීමක් කළ දින සිට මාස හතක් ගතවූ දිනයේ සිට ඊළගට එළඹෙන දින 30 ඇතුළත බදු අභියාචනා කොමිෂම වෙත අභියාචනයක් ඉදිරිපත් කළහැකිය.

***2.1.13.2 එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් සිදු කළ ප්‍රතිපත්තිමය වෙනස්කම්***

2016 මැයි මස 02 වන දින හෝ එදිනට පසු එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වූ තොග සහ සිල්ලර වෙළඳාමේ නිරත තැනැත්තන් හට ලියාපදිංචි නොවූ තැනැත්තන්ගෙන් මිලදී ගැනීම් සඳහා ප්‍රදානය කර තිබූ යැයි සැලකෙන යෙදවුම් බදු බැර පහසුකම 2021 මැයි මස 13 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉවත් කෙරේ. සියළුම තැනැත්තන් සඳහා ලියාපදිංචි සීමාවක් කාර්තුවකට රුපියල් මිලියන 75 ක් සහ වර්ෂයකට රුපියල් මිලියන 300 දක්වා ඉහල නංවා ඇත.

***2.1.13.3 2021 අංක 18 දරන මුදල් පනත***

1. දේශීය ආදායම් පනත් සහ එ.අ.බ. පනත් යටතේ ආදායම් සහ වත්කම් ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම් මත 1% ක බද්දක් ගෙවීමෙන් බදු අය කළ හැකි හෙළි නොකළ සැපයුම් ස්වේච්ඡාමය ලෙස හෙළිදරව් කිරීමට තැනැත්තන් හට පහසුකම් සලසා ඇත.

2. 2020 අප්‍රේල් 01 වන දිනට පෙර ආරම්භ වන ඕනෑම තක්සේරු වර්ෂයක් හෝ 2020 දෙසැම්බර් 31 වන දිනට පෙර ආරම්භ වන ඕනෑම බදු අය කල හැකි කාලපරිච්ඡේදයක් සඳහා ආර්ථික සේවා ගාස්තු, ජාතිය ගොඩනැගීමේ බද්ද ඇතුළුව ආදායම් බදු, එකතු කල අගය මත බදු සහ සේවාන්ත බදු මත හිග බදු කපා හැරීම සහ දණ්ඩන අත්හැර දැමීමට ඉඩ සලසා දෙයි.

**2.1.14 වර්ෂය තුල පැනවූ නීති සම්පාදනයන්**

- 2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත
- 2021 අංක 9 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත
- 2021 අංක 18 දරන මුදල් පනත

**2.1.15 වර්ෂය තුල නිකුත් කළ ගැසට් නිවේදන**

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සහ 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනත යටතේ ගත වූ වර්ෂය තුළ පහත සඳහන් ගැසට් නිවේදන නිකුත් කර ඇත.

**2.18 වගුව : 2021 වර්ෂය තුල ප්‍රකාශයට පත් කල ගැසට් නිවේදන**

| | ගැසට් අංකය | දිනය | විස්තරය |
|---|---|---|---|
| i | 2217/07 | 2021.03.02 | පැවරුම් මිල සම්බන්ධයෙන් රෙගුලාසි |
| ii | 2232/06 | 2021.06.14 | පළමුවන සහ තුන්වන උපලේඛනයේ 5, 10 වගන්ති යටතේ වන නිවේදනය |
| iii | 2234/06 | 2021.06.29 | 2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත මගින් සංශෝධනය කර ඇති පරිදි 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ තුන්වන උපලේඛනයේ ( ද ) ඡේදයේ ( ii) වන උපඡේදයේ කාර්යයන් නියම වූ තොරතුරු තාක්ෂණ සහ සහායක සේවය |
| iv | 2234/07 | 2021.06.29 | 2021 අංක 9 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් සංශෝධනය කළ 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පස්වන උපලේඛනයේ 11 වන කොටසේ (ආ) ඡේදයේ (54) අයිතමයේ කාර්යයන් සඳහා නියම කල තොරතුරු තාක්ෂණ සහ සහායක සේවා |
| v | 2258/18 | 2021.12.14 | හයවන උපලේඛනයේ 10 වන ඡේදය යටතේ නිවේදනය |

මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## 2.2 දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අභියෝග සහ අනාගත අරමුණු

### 2.2.1 අභියෝග

#### *2.2.1.1 කොවිඩ් අර්බුදය හමුවේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය*

කොවිඩ් 19 කාල පරිච්ඡේදය තුල දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට බදු රැස් කිරීම අභියෝගයක් වූයේ බදු ප්‍රතිපත්තීන්හි වෙනස්කම් මෙන්ම සේවකයින් සේවයට කැඳවා ගැනීමේ අපහසුතාවය හේතුවෙනි. බදු පරිපාලනය කාර්යක්ෂම කර ගැනීම සඳහා 2021 වසර තුල දෙපාර්තමේන්තුව විසින් වරින් වර චක්‍රලේඛ හා රෙගුලාසි හඳුන්වා දෙනු ලැබිණි. ඒ අනුව, බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංක නිකුත් කිරීම, ආනයනකරුවන් සඳහා තාවකාලික එ.අ.බ. ලියාපදිංචිය, බාහිර ප්‍රේෂණ සඳහා බදු නිෂ්කාශණ යනාදී පොදු බදු සේවාවන් මාර්ගගත ක්‍රමය/විද්‍යුත් තැපැල හරහා රට වසා තැබූ කාලය තුලදී ද අඛණ්ඩව සිදු කිරීමට නිවසේ සිට වැඩ කිරීම හරහා හැකියාව ලැබුණි.

#### *2.2.1.2 දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස දේ.ආ.දෙ. රැස් කිරීමේ ඌණ දායකත්වය*

වාර්තා ප්‍රකාරව 2021 දී දළ දේශීය නිෂ්පාදිතයට 7.7% ක් වූ ශ්‍රී ලංකාවේ බදු අනුප්‍රමාණය අනෙකුත් රටවල් සමග සැසඳූ විට ඉතාමත් අවම අගයක පවතී. තවදුරටත් සඳහන් කිරීමේදී අදාල ප්‍රතිශතය මෙරට නිදහස ලබා ගැනීමෙන් අනතුරුව වාර්තා වූ අවම අගය ලෙස සැලකිය හැකිය.

ඉහත තත්වය සලකා බැලූ විට රාජ්‍ය මුදල් සඳහා සැලකිය යුතු ප්‍රමාණයක බදු ආදායමක් එකතු කර ගැනීමට දේ.ආ.දෙ. අපොහොසත් වූ බව පෙනෙන අතර බදු අනුකූලතා පරතරය පිලිබඳව ද අවධානය යොමු කළ යුතුය. කෙසේ නමුදු ශ්‍රී ලංකාව විදේශ ණය මත යැපීය ඉහළ මට්ටමක පවතින බැවින් මෙය අඛණ්ඩව පවතින අභියෝගයක් ලෙස සැලකිය යුතුය. ණය උගුලෙන් ගැලවීම සඳහා දේශීයව බදු එකතු කිරීමේ ක්‍රියාවලිය සුවිශාල කාර්යභාරයක් ඉටු කරයි. එහෙයින් වඩාත් ඵලදායී ප්‍රතිඵල ලබා ගැනීම උදෙසා නිසි කුසලතාවයෙන් සහ නිපුණත්වයෙන් යුතුව මෙම ක්‍රියාවලිය පවත්වාගෙන යා යුතුය.

### *2.2.1.3 සෘජු හා වක්‍ර බදු අනුපාතය*

ශ්‍රී ලංකා රජය විසින් පනවා ඇති බදු පිළිබඳව සාකච්ඡා කිරීමේදී සෘජු සහ වක්‍ර ලෙස ප්‍රධාන බදු වර්ග දෙකක් හඳුනාගත හැකිය. ශ්‍රී ලංකා මහා බැංකු වාර්තා ප්‍රකාරව බදු යනු රජයේ වඩාත්ම වැදගත් ආදායම් මූලාශ්‍රය වන අතර එය රාජ්‍ය ආදායමේ සැලකිය යුතු කොටසක් නියෝජනය කරයි.

මෙම අසමානතාවය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ සැලකිල්ල යොමු වී ඇති අතර වසර ගණනාවක් මුළුල්ලේ එය අපේක්ෂිත අනුපාතය වෙත ළඟාවීමට හෝ අනුපාතය වෙනස් කිරීමට සමත් වී නැත. මෙම ක්‍රියාවලිය උදෙසා ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ සහ බදු පරිපාලකයින්ගේ කුසලතාවය සහ විනය අවශ්‍ය වේ. මෙහි දී වක්‍ර බදු ක්‍රමයෙන් කපා හරිමින් ආදායම් බදු පදනම පුළුල් කිරීම සිදු කල යුතුය.

## 2.2.2 අනාගත ඉලක්ක

### *2.2.2.1 බදු අභියාචන ක්‍රියාවලිය විධිමත් කිරීම*

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු අභියාචන ක්‍රියාවලිය විශ්වාසදායක අයුරින් වැඩි දියුණු කරන්නේ නම් එය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සංවර්ධනය සඳහා ඉවහල් වනු ඇත. මෙම ක්‍රියාවලියේ මුල් පියවර දෙක වනුයේ පරිපාලනමය ස්වභාවය සහ නීතිය ප්‍රශ්න කිරීම සම්බන්ධයෙන් අභියාචකයාට අභියාචනාධිකරණය සහ ශ්‍රේෂ්ඨාධිකරණයට ප්‍රවේශ විය හැකි වීමයි.

### *2.2.2.2 බදු පිළිබඳ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම*

සම්මන්ත්‍රණ සහ පුහුණු වැඩමුළු පවත්වමින් බදු ගෙවන්නන් සහ අදාළ පාර්ශවයන් අතර බදු පිළිබඳව දැනුවත්භාවය ඇති කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නිසි ප්‍රයත්න දරයි. බදු පිළිබඳව දැනුවත්භාවය ඇති කිරීම තුලින් බදු ගෙවීම පැහැර හැරීම අවම කරමින් බදු එකතු කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට ඉඩ ප්‍රස්ථා සලසයි.

### *2.2.2.3 හිඟ බදු කපා හැරීම*

2021.12.31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් වාර්තා කර ඇති හිඟ බදු ප්‍රමාණය 2022 වසර සඳහා මුදල් අමාත්‍යාංශය විසින් දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇති ආදායම් ඇස්තමේන්තුවට 17.6% කි. 2021 අංක 10 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනතේ 58 (1) වගන්තිය හා 2021 අංක 10 දරන මුදල් පනතේ 2 කොටස ප්‍රකාරව හිඟ බදු කපා හැරීමේ බලතල දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ලබා දී ඇත. ඒ අනුව කටයුතු කර අයකර ගැනීමට අපහසුව පවතින හිඟ බදු ප්‍රමාණය අවම කර ගැනීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අපේක්ෂාව වේ.



...........................................................

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

# 3 වන පරිච්ඡේදය

## වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ - එෆ්

**2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

| අයවැය 2021 | | සටහන | තත්‍ය | |
|---|---|---|---|---|
| | | | | නැවත ගලපන ලද |
| | | | 2021 | 2020 |
| රු. | | | රු. | රු. |
| - | **ආදායම් ලැබීම්** | | | - |
| 295,000,000,000 | ආදායම් බදු | 1 | 302,115,199,047 | 268,249,209,463 |
| 317,614,500,000 | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | 317,600,153,060 | 242,940,291,128 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - |
| 612,614,500,000 | **මුළු ආදායම් ලැබීම් (අ)** | | 619,715,352,107 | 511,189,500,591 |
| - | **ආදායම් නොවන ලැබීම්** | | **-** | - |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 14,028,178,350 | 9,197,707,273 |
| - | තැන්පතු | | 9,567,919,307 | 10,204,093,014 |
| - | අත්තිකාරම් ගිණුම් | | 129,575,000 | 108,549,754 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | 119,871,581 |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **23,725,672,656** | 19,630,221,622 |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **643,441,024,763** | 530,819,722,213 |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | **8,046,782,572** | 3,276,304,266 |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **635,394,242,191** | 527,543,417,947 |
| | **අඩු කළා : වියදම්** | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | | |
| 3,334,000,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 2,707,274,006 | 2,736,627,225 |
| 1,177,117,500 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 906,628,915 | 880,073,961 |
| 50,500,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 33,581,025 | 44,759,905 |
| | පොළී ගෙවීම් | 8 | - | - |
| 190,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | 221,898 |
| 4,561,807,500 | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **3,647,483,946** | **3,661,682,989** |
| | **මූලධන වියදම්** | | | |
| 257,400,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 38,726,693 | 139,771,299 |

| | | | | |
|---|---|---|---|---|
| 1,335,782,500 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | 873,776,860 | 292,604,766 |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | - | - |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | - | - |
| 200,000,000 | හැකියා වර්ධනය | **14** | 17,011,907 | 19,744,234 |
| - | වෙනත් මූලධන වියදම් | **15** | - | 375,918,921 |
| **1,793,182,500** | **මුළු මූලධන වියදම් (උ)** | | **929,515,460** | **828,039,220** |
| | තැන්පතු ගෙවීම් | | 10,947,718,434 | 8,767,542,467 |
| | අත්තිකාරම් ගෙවීම් | | 142,351,298 | 69,098,744 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **11,090,069,732** | **8,836,641,211** |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 15,667,069,139 | 13,326,363,420 |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | 619,727,173,052 | 514,217,054,527 |
| | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය** | | 619,727,173,052 | 514,217,054,527 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | - |
| | | | 619,727,173,052 | 514,217,054,527 |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

**2021 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | සත්‍ය 2021 රු. | 2020 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 6,953,525,804 | 5,971,059,959 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 347,907,610 | 335,131,311 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **7,301,433,414** | **6,306,191,271** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (710,172,145) | (2,102,747,571) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 6,953,525,804 | 5,971,059,959 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | - | - |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 1,058,079,755 | 2,437,878,882 |
| අයිරා ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **7,301,433,414** | **6,306,191,271** |

පිටු අංක 7 සිට 46 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 47 සිට 59 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහි අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ................ | ................ | ................ |
| එස්.ආර්.ආටිගල | එච්.එම්.ඩබ්.සී.බණ්ඩාර | එන්.විජේවීර |
| ලේකම් / ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | කොමසාරිස් ජනරාල්/ ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි |
| මුදල් අමාත්‍යාංශය | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව |
| දිනය : 25/2/22 | දිනය : 2022/02/24 | දිනය : 2022/02/24 |

එස්. ආර්. ආටිගල
මහා භාණ්ඩාගාරයේ සහ මුදල් අමාත්‍යාංශයේ ලේ
මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01.

එච්. එම්. ඩබ්. සී. බණ්ඩාර
කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
කොළඹ 02

2

එන්. විජේවීර
ප්‍රධාන මූල්‍ය නිලධාරී (වැ.බ.)
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
කොළඹ 02.

## 3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

**2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | තත්‍ය | නැවත ගලපන ලද |
|---|---|---|
| | **2021** | **2020** |
| | රු. | රු. |
| <u>**මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | - |
| මුළු බදු ලැබීම් | 497,995,981,909 | 430,694,440,966 |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 141,018,036 | 119,734,545 |
| අග්‍රිම ලැබීම් | 14,028,178,350 | 9,214,232,549 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 133,653,882 | 113,693,063 |
| තැන්පතු ලැබීම් | 8,760,068,280 | 8,026,271,324 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **521,058,900,457** | **448,168,372,446** |
| | | |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 3,612,667,491 | 3,614,227,014 |
| සහනාධාර සහ මාරුකිරීම් | 33,581,025 | 44,759,905 |
| බදු ආපසු ගෙවීම් එකතුව | 497,366,667,619 | 431,607,207,970 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 4,965,863 | 38,240,980 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 8,046,782,572 | 3,276,304,266 |
| අත්තිකාරම් ගෙවීම් | 141,539,181 | 68,950,345 |
| තැන්පතු ගෙවීම් | 10,947,718,434 | 8,767,542,467 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **520,153,922,185** | **447,417,232,946** |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **904,978,272** | **751,139,500** |
| | | |
| <u>**ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **-** | **-** |
| | | |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 904,978,272 | 751,139,500 |

| | | |
|---|---|---|
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **904,978,272** | **751,139,500** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)** | **(904,978,272)** | **(751,139,500)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **-** | **-** |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **-** | **-** |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **-** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | **-** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **-** | **-** |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්

සටහන -(i)

### පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය
### (මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ වන පාඩු)

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
වියදම් ශිර්ෂ අංකය: 246
වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් වැඩසටහන

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/කපාහැරීම/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

| | අගය | | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු) |
|---|---|---|---|---|
| රු | 25,000.00 | අඩු | 0 | 0.00 |
| රු | 25,000.01 | වැඩි | 0 | 0.00 |
| | එකතුව | | | නැත |

| අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය | සිද්ධි සංඛ්‍යාව | අගය (රු) |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| එකතුව | | නැත |

(ii) තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය

| | අගය | | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු) |
|---|---|---|---|---|
| රු | 25,000.00 | අඩු | | |
| රු | 25,000.01 | වැඩි | | |
| | එකතුව | | | නැත |

(ii) අනුව කාල විශ්ලේෂණය

| | | |
|---|---|---|
| වසර 5 ට අඩු | සිද්ධි සංඛ්‍යාව | |
| | ගණන | රු |
| වසර 5-10 | සිද්ධි සංඛ්‍යාව | |
| | ගණන | රු |
| වසර 10 ට වැඩි | සිද්ධි සංඛ්‍යාව | |
| | ගණන | රු |

| අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය | සිද්ධි සංඛ්‍යාව | අගය (රු) |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| එකතුව | | |

සටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මු.රෙ. 106 යටතේ වන හානි හා මු.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

සටහන-(ii)

## පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශය

**අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : දේශිය ආදායම් දෙපාර්තමේන්තුව**
**වියදම් ශීර්ෂ අංකය : 246**
වැඩසටහන් අංකය හා නාමය: **01** මෙහෙයුම් වැඩසටහන

1 වර්ෂය තුළ සිදුවූ මූ.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

| | අගය | සිද්ධි සංඛ්‍යාව | වටිනාකම (රු) |
|---|---|---|---|
| (i) | රු. 25,000.00 අඩු | 2 | 36,400 |
| (ii) | රු. 25,000.01 වැඩි | 5 | 357,063 |
| | එකතුව | 7 | 393,463 |

2 වර්ෂය තුළ මූ.රෙ. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශය

| අලාභයේ ස්වභාවය | ආරම්භක කපා නොහල ශේෂය රු. | අලාභයේ වටිනාකම රු. | අයකර ගැනීම් රු. | පොතෙන් කපා හල අගය රු. | කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය රු. | පොතෙන් කපා හැරිම සඳහා වු අනුමැතියේ යොමු අංකය |
|---|---|---|---|---|---|---|
| **2019 වර්ෂයේ දී සිදු වූ අලාභ** | | | | | | |
| රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය ගිණි ගැනීම | 0 | 3,237,053 | - | | 3,237,053 | පොතෙන් කපා හැරිම සඳහා මෙතෙක් අනුමැතියක් ලැබී නැත. |
| CAD -159 | 1,676 | | | | 1,676 | පොතෙන් කපා හැරිම සඳහා කටයුතු කරමින් පවතී |
| CAD -0046 | 11,726 | | | | 11,726 | පොතෙන් කපා හැරිම සඳහා කටයුතු කරමින් පවතී |
| CAC -9954 | 838 | | | | 838 | පොතෙන් කපා හැරිම සඳහා කටයුතු කරමින් පවතී |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| CAC -0165 | 15,636 | | | | 15,636 | පොතෙන් කපා හැරීම සඳහා කටයුතු කරමින් පවතී |
| **එකතුව** | **29,876** | **3,237,053** | **0** | **0** | **3,266,929** | |
| **2020 වර්ෂයේ දී සිදු වූ අලාභ** | | | | | | |
| CAC -9941 | 34,691 | | | | 34,691 | පොතෙන් කපා හැරීම සඳහා කටයුතු කරමින් පවතී |
| PB -6852 | 811,600 | | | | 811,600 | අදාල ආයතනය විසින් අවසාන බිල්පත ඉදිරිපත් කර නැත. |
| NA-5667 | 14,200 | | | | 14,200 | පොතෙන් කපා හැරීම සඳහා කටයුතු කරමින් පවතී |
| **එකතුව** | **860,491** | - | - | - | **860,491** | |
| **2020 වර්ෂයේ දී සිදු වූ අලාභ සඳහා 2021 වර්ෂයේදී අයකර ගැනීම්** | | | | | | |
| NA-5667 මෝටර් වෑන් | - | 23,500 | 23,500 | - | - | මුළු අයකර ගැනීම් මගින් අලාභය යථාවත් වී ඇති බැවින් රජයට කිසිදු අලාභයක් සිදුව නැත. ඒ සඳහා පොතෙන් කපා හැරීමක් සිදු කිරීමට අවශ්‍ය නොවේ. |
| CAC - 9936 - මෝටර් කාර් | 822,260 | 410,623 | 410,623 | - | - | අලුත්වැඩියාව සඳහා යොමුකල ආයතනයෙන් රු:822,260.22 ඇස්තමේන්තු කර තිබුණද, රක්ෂණ ආයතනය විසින් ඇස්තමේන්තු කර ඇත්තේ රු: 410,623.20ක මුදලකි. එම මුදල රක්ෂණ ආයතනය හා රියදුරු මහතා විසින් යථාවත් කර ඇති බැවින් රජයට කිසිදු අලාභයක් සිදුව නැත. ඒ සඳහා පොතෙන් කපා හැරීමක් සිදු කිරීමට අවශ්‍ය නොවේ. |
| | - | 119,849 | 119,849 | - | - | |
| | | 36,096 | 36,096 | - | - | |
| CAD-0047 - මෝටර් කාර් | - | 65,700 | 65,700 | - | - | මුළු අයකර ගැනීම් මගින් අලාභය යථාවත් වී ඇති බැවින් රජයට කිසිදු අලාභයක් සිදුව නැත. ඒ සඳහා පොතෙන් කපා හැරීමක් සිදු කිරීමට අවශ්‍ය නොවේ. |
| JO - 8478 - මෝටර් කාර් | - | 226,700 | 226,700 | - | - | මුළු අයකර ගැනීම් මගින් අලාභය යථාවත් වී ඇති බැවින් රජයට කිසිදු අලාභයක් සිදුව නැත. ඒ සඳහා පොතෙන් කපා හැරීමක් සිදු කිරීමට අවශ්‍ය නොවේ. |
| **එකතුව** | **822,260** | **882,468** | **882,468** | **-** | **-** | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **2021 වර්ෂයේ සිදු වූ අලාභ සඳහා 2021 වර්ෂයේ දී අය කර ගැනීම්** | | | | | | |
| CAC- 9944 | - | 35,300 | 35,300 | - | - | මුළු අයකර ගැනීම් මගින් අලාභය යථාවත් වී ඇති බැවින් රජයට කිසිදු අලාභයක් සිදුව නැත. ඒ සඳහා පොතෙන් කපා හැරීමක් සිදු කිරීමට අවශ්‍ය නොවේ. |
| NA-5664 | - | 12,500 | 12,500 | - | - | මුළු අයකර ගැනීම් මගින් අලාභය යථාවත් වී ඇති බැවින් රජයට කිසිදු අලාභයක් සිදුව නැත. ඒ සඳහා පොතෙන් කපා හැරීමක් සිදු කිරීමට අවශ්‍ය නොවේ. |
| KC - 4896 | - | 57,250 | 57,250 | - | - | මුළු අයකර ගැනීම් මගින් අලාභය යථාවත් වී ඇති බැවින් රජයට කිසිදු අලාභයක් සිදුව නැත. ඒ සඳහා පොතෙන් කපා හැරීමක් සිදු කිරීමට අවශ්‍ය නොවේ. |
| CBI - 0486 මෝටර් කාර් | - | 176,388 | 176,388 | - | - | මුළු අයකර ගැනීම් මගින් අලාභය යථාවත් වී ඇති බැවින් රජයට කිසිදු අලාභයක් සිදුව නැත. ඒ සඳහා පොතෙන් කපා හැරීමක් සිදු කිරීමට අවශ්‍ය නොවේ. |
| NA - 9123 | - | 23,900 | 23,900 | - | - | මුළු අයකර ගැනීම් මගින් අලාභය යථාවත් වී ඇති බැවින් රජයට කිසිදු අලාභයක් සිදුව නැත. ඒ සඳහා පොතෙන් කපා හැරීමක් සිදු කිරීමට අවශ්‍ය නොවේ. |
| KC - 4895 මෝටර් කාර් | - | 30,875 | 30,875 | - | - | මුළු අයකර ගැනීම් මගින් අලාභය යථාවත් වී ඇති බැවින් රජයට කිසිදු අලාභයක් සිදුව නැත. ඒ සඳහා පොතෙන් කපා හැරීමක් සිදු කිරීමට අවශ්‍ය නොවේ. |
| KC - 4896 මෝටර් කාර් | - | 57,250 | 57,250 | - | - | මුළු අයකර ගැනීම් මගින් අලාභය යථාවත් වී ඇති බැවින් රජයට කිසිදු අලාභයක් සිදුව නැත. ඒ සඳහා පොතෙන් කපා හැරීමක් සිදු කිරීමට අවශ්‍ය නොවේ. |
| **එකතුව** | - | **393,463** | **393,463** | - | - | |
| **මුළු එකතුව** | **1,712,627** | **4,512,984** | **1,275,931** | - | **1,217,420** | |

සටහන - සටහන (i) හි ඇතුළත් ගිණුම්ගත කළ යුතු පාඩු හා අත්හැරීම් හැර මු.රෙ. 109 යටතේ වන අනෙකුත් පාඩු හා අත්හැරීම් පමණක් මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතු ය.

## දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය

**අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**

**වියදම් ශීර්ෂ අංකය: 246**

**වැඩසටහන් අංකය හා නාමය: 01 මෙහෙයුම් වැඩසටහන**

| පුද්ගලයාගේ/ආයතනයේ නම | බැඳීම් අංකය | දිනය | ශීර්ෂය | වැඩසටහන | ව්‍යාපෘතිය | උප ව්‍යාපෘතිය | වැය විෂයය | අයිතම අංකය | මූල්‍යකරණය | බැඳීම් (රු.) | බැඳීම් ශේෂය (රු.) | බැරකම්වලට ඇතුළත් වූ දිනය | බැරකම් වටිනාකම (රු.) | සංශෝධිත බැරකම (රු.) | බැරකම් නිදහස් කිරීම (රු.) | බැරකම් ශේෂය (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | (1) | (2)=(1)-(3) | | (3) | (4) | (5) | (6)=(4)-(5) |
| **1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු** | | | | | | | | | | | | | | | | |
| එම්.ටී.එම්. ඉන්ද්‍රවංශ මහතා සහ පුද්ගලයන් 5 - වැඩ බලන දීමනා | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1001 | | 11 | 438,490 | 438,490 | | | | | |
| එස්.එන්. ලියනපතිරණ මහතා - හිඟ | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1001 | | 11 | 79,801 | 79,801 | | | | | |
| උප එකතුව | | | | | | | | | | **518,291** | **518,291** | | | | | |
| එල්. යානගේ සහ වෙනත් - අතිකාල සහ නිවාඩු දින ගෙවීම් | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1002 | | 11 | 1,753,333 | 1,753,333 | | | | | |
| කොමසාරිස් දේශීය ආදායම් ප්‍රාදේශීය කාර්යාලය කළුතර - අතිකාල දීමනා සහ නිවාඩු දින ගෙවීම් | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1002 | | 11 | 8,674 | 8,674 | | | | | |
| කොමසාරිස් දේශීය ආදායම් ප්‍රාදේශීය කාර්යාලය නුවර - අතිකාල දීමනා සහ නිවාඩු දින ගෙවීම් | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1002 | | 11 | 31,503 | 31,503 | | | | | |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කොමසාරිස් දේශීය ආදායම් ප්‍රාදේශීය කාර්යාලය කුරුණෑගල - අතිකාල දීමනා සහ නිවාඩු දින ගෙවීම් | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1002 | | 11 | 5,580 | 5,580 | | | | | |
| **උප එකතුව** | | | | | | | | | | **1,799,090** | **1,799,090** | | | | | |
| බී.එල්.කේ. බාලසූරිය සහ වෙනත් - ගමන් වියදම් | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1101 | | 11 | 178,051 | 178,051 | | | | | |
| **උප එකතුව** | | | | | | | | | | **178,051** | **178,051** | | | | | |
| කොමසාරිස් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ප්‍රාදේශීය කාර්යාලය බදුල්ල, රත්නපුර, ගාල්ල - ලිපිද්‍රව්‍ය | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1201 | | 11 | 11,290 | 11,290 | | | | | |
| **උප එකතුව** | | | | | | | | | | **11,290** | **11,290** | | | | | |
| කොමසාරිස් දේශීය ආදායම් ප්‍රාදේශීය කාර්යාලය කෑගල්ල, යාපනය, කොළඹ දකුණ, මඩකලපුව, රත්නපුර, මැද කොළඹ - ඉන්ධන ගෙවීම් | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1202 | | 11 | 82,757 | 82,757 | | | | | |
| **උප එකතුව** | | | | | | | | | | **82,757** | **82,757** | | | | | |
| බී.ඒ.ටී.ප්‍රියංගනී මිය - නිළ ඇඳුම් දීමනා | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1203 | | 11 | 4,000 | 4,000 | | | | | |
| **උප එකතුව** | | | | | | | | | | **4,000** | **4,000** | | | | | |
| කොමසාරිස් දේශීය ආදායම් ප්‍රාදේශීය කාර්යාලය රත්නපුර - දුම් පරීක්ෂණ | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1301 | | 11 | 1,045 | 1,045 | | | | | |
| එස්.එස්.ඩී. ගමගේ මහතා - ඇස් පරීක්ෂාව | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1301 | | 11 | 800 | 800 | | | | | |
| **උප එකතුව** | | | | | | | | | | **1,845** | **1,845** | | | | | |
| කොමසාරිස් දේශීය ආදායම් ප්‍රාදේශීය කාර්යාලය නැ. මහරගම, යාපනය, කළුතර. අනුරාධපුර, බදුල්ල - දුරකථන බිල්, තැපැල් | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1402 | | 11 | 17,815 | 17,815 | | | | | |
| තැපැල් ස්ථානාධිපති ජනරාල් - තැපැල් | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1402 | | 11 | 2,950 | 2,950 | | | | | |
| **උප එකතුව** | | | | | | | | | | **20,765** | **20,765** | | | | | |
| නාගරික කොමසාරිස් - නගර සභාව - නුවරඑලිය, කුරුණෑගල - ජල බිල් | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1403 | | 11 | 15,339 | 15,339 | | | | | |
| කම්කරු කොමසාරිස් ජනරාල් - විදුලි බිල | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1403 | | 11 | 14,908 | 14,908 | | | | | |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **උප එකතුව** | | | | | | | | | | **30,246** | **30,246** | | | | | |
| නාගරික කොමසාරිස් - නගර සභාව - මාතර - කුලිය | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1404 | | 11 | 36,329 | 36,329 | | | | | |
| **උප එකතුව** | | | | | | | | | | **36,329** | **36,329** | | | | | |
| කොමසාරිස් දේශීය ආදායම් ප්‍රාදේශීය කාර්යාලය - යාපනය, නුවර එළිය, බදුල්ල සහ මාතර - වෙනත් | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1409 | | 11 | 10,085 | 10,085 | | | | | |
| කොමසාරිස් දේශීය ආදායම් ප්‍රාදේශීය කාර්යාලය - කලුතර - පුවත්පත් බිල් | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1409 | | 11 | 2,760 | 2,760 | | | | | |
| කොමසාරිස් - නුවර එළිය - පුවත්පත් | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1409 | | 11 | 6,210 | 6,210 | | | | | |
| **උප එකතුව** | | | | | | | | | | **19,055** | **19,055** | | | | | |
| කම්කරු කොමසාරිස් ජනරාල් - පුනරුත්ථාපන ගොඩනැගිල්ල | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 2001 | | 11 | 320,000 | 320,000 | | | | | |
| **උප එකතුව** | | | | | | | | | | **320,000** | **320,000** | | | | | |
| **එකතුව** | | | | | | | | | | **3,021,719** | **3,021,719** | | | | | |
| | | | | | | | | | | | | | | | | |
| **2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල** | | | | | | | | | | | | | | | | |
| ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය - ගමන් වියදම් හිමිකම් | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1101 | | 11 | 1,200 | 1,200 | | | | | |
| **උප එකතුව** | | | | | | | | | | **1,200** | **1,200** | | | | | |
| දිස්ත්‍රික් කළමණාකරු - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ගාල්ල - වාහන අළුත්වැඩියාව | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1301 | | 11 | 1,045 | 1,045 | | | | | |
| **උප එකතුව** | | | | | | | | | | **1,045** | **1,045** | | | | | |
| ලංකා විදුලි බල මණ්ඩලය - විදුලි බිල් | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1403 | | 11 | 7,498,367 | 7,498,367 | | | | | |
| ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය - ජල බිල් සහ විදුලි බිල් | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1403 | | 11 | 38,124 | 38,124 | | | | | |
| **උප එකතුව** | | | | | | | | | | **7,536,491** | **7,536,491** | | | | | |
| රුහුණුපුර ආයතනය | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1409 | | 11 | 83,520 | 83,520 | | | | | |
| **උප එකතුව** | | | | | | | | | | **83,520** | **83,520** | | | | | |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා රජයේ වාණිජ නීතිගත සංස්ථාව (සාමාන්‍ය) | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 2102 | | 11 | 45,000 | 45,000 | | | | | |
| **උප එකතුව** | | | | | | | | | | **45,000** | **45,000** | | | | | |
| **එකතුව** | | | | | | | | | | **7,667,256** | **7,667,256** | | | | | |
| | | | | | | | | | | | | | | | | |
| 3. වෙනත් (පෞද්ගලික අංශය) | | | | | | | | | | | | | | | | |
| කේ.කේ.අයි.කන්නන්ගර - ලිපිද්‍රව්‍ය | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1201 | | 11 | 4,800 | 4,800 | | | | | |
| **උප එකතුව** | | | | | | | | | | **4,800** | **4,800** | | | | | |
| සී.එෆ්. ද මෙල් සහ පුත්‍රයෝ (පෞද්ගලික) සමාගම | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1202 | | 11 | 114,363 | 114,363 | | | | | |
| **උප එකතුව** | | | | | | | | | | **114,363** | **114,363** | | | | | |
| රිලයබල් මෝටර් ට්‍රේඩ්ස් (පෞද්ගලික) සමාගම | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1301 | | 11 | 99,200 | 99,200 | | | | | |
| **උප එකතුව** | | | | | | | | | | **99,200** | **99,200** | | | | | |
| මාස්ටර් වර්ක්ස් (පෞද්ගලික) සමාගම - නඩත්තු | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1302 | | 11 | 131,220 | 131,220 | | | | | |
| සිලෝන් බිසිනස් ඇපලයන්ස් (පෞද්ගලික) සමාගම - මුද්දර යන්ත්‍ර නඩත්තුව, ඡායා පිටපත් යන්ත්‍ර නඩත්තුව | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1302 | | 11 | 91,677 | 91,677 | | | | | |
| එන්. ඒබල් (පෞද්ගලික) සමාගම - නඩත්තු | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1302 | | 11 | 9,137,880 | 9,137,880 | | | | | |
| ජෙෆ්කෝ සෙන්ට් (පෞද්ගලික) සමාගම - නඩත්තු | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1302 | | 11 | 140,243 | 140,243 | | | | | |
| සිවිමෙක් (පෞද්ගලික) සමාගම - නඩත්තු | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1302 | | 11 | 424,391 | 424,391 | | | | | |
| දූල්මා එයාර් කන්ඩිෂනින්ග් (පෞද්ගලික) සමාගම - නඩත්තු | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1302 | | 11 | 18,849 | 18,849 | | | | | |
| ට්‍රේඩ් ප්‍රමෝටර්ස් (පෞද්ගලික) සමාගම - නඩත්තු | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1302 | | 11 | 394,903 | 394,903 | | | | | |
| බ්‍රයිටෙක්ස් සේෆ්ටි හවුස් -නඩත්තු | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1302 | | 11 | 1,250 | 1,250 | | | | | |
| ස්කයි එලිවේටර්ස් - නඩත්තු | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1302 | | 11 | 75,000 | 75,000 | | | | | |
| ඇපොජී ජාත්‍යන්තර (පෞද්ගලික) සමාගම - නඩත්තු | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1302 | | 11 | 5,402,465 | 5,402,465 | | | | | |
| සැට් (පෞද්ගලික) සමාගම - හදිසි සැලැස්ම (Contingency plan) | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1302 | | 11 | 20,744,895 | 20,744,895 | | | | | |
| තාක්ෂණික ගිණි ආවරණ සහ ඉංජිනේරු සේවා (පෞද්ගලික) සමාගම - ගිනි නිවන පද්ධතිය අළුත්වැඩියා කිරීම | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1302 | | 11 | 124,200 | 124,200 | | | | | |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මෙට්‍රොපොලිටන් තාක්ෂණික (පෞද්ගලික) සමාගම - මුද්‍රණ යන්ත්‍ර නඩත්තුව | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1302 | | 11 | 33,750 | 33,750 | | | | | |
| ටී එෆ් ටී ඉංජිනේරු සේවා (පෞද්ගලික) සමාගම -ගිනි නිවන පද්ධතිය අළුත්වැඩියා කිරීම සහ ජලය කාන්දුවීම හදුනා ගැනීම | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1302 | | 11 | 124,200 | 124,200 | | | | | |
| **උප එකතුව** | | | | | | | | | | **36,844,924** | **36,844,924** | | | | | |
| ජයරත්න ඉදිරිකිරීම් සහ සැපයීම් - නඩත්තු වියදම් | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1303 | | 11 | 817,298 | 817,298 | | | | | |
| **උප එකතුව** | | | | | | | | | | **817,298** | **817,298** | | | | | |
| මොබිටෙල් (පෞද්ගලික) සමාගම - දුරකථන බිල් | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1402 | | 11 | 8,107 | 8,107 | | | | | |
| ශ්‍රී ලංකා ටෙලිකොම් (පෞද්ගලික) සමාගම - දුරකථන බිල්, අන්තර්ජාල ගෙවීම්, දුරකථන | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1402 | | 11 | 6,711,842 | 6,711,842 | | | | | |
| ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්ස් (පෞද්ගලික) සමාගම - අන්තර්ජාල ගෙවීම් | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1402 | | 11 | 213,586 | 213,586 | | | | | |
| මහජන බැංකුව - තැපැල් | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1402 | | 11 | 1,727,630 | 1,727,630 | | | | | |
| එස්.එස්.ඩී. ගමගේ - දුරකථන බිල් | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1402 | | 11 | 1,613 | 1,613 | | | | | |
| **උප එකතුව** | | | | | | | | | | **8,662,779** | **8,661,166** | | | | | |
| ලංකා විදුලිබල පෞද්ගලික සමාගම - විදුලි | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1403 | | 11 | 91,823 | 91,823 | | | | | |
| එක්ස්ප්‍රස් වෝටර් සිස්ටම් (පෞද්ගලික) සමාගම - ජල බෝතල් | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1403 | | 11 | 11,700 | 11,700 | | | | | |
| ඔරියන්ට් ෆිනෑන්ස් පීඑල්සී - ජල බිල් සහ විදුලිබිල් | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1403 | | 11 | 139,956 | 139,956 | | | | | |
| එම්. ජයසේන මහතා - ජලය | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1403 | | 11 | 133,592 | 133,592 | | | | | |
| **උප එකතුව** | | | | | | | | | | **377,072** | **377,072** | | | | | |
| ෆෙයාර් වේ ඩිවලොප්මන්ට් සමාගම - බදු ගොඩනැගිලි | | 12/31/2021 | 246 | 1 | 1 | 0 | 1404 | | 11 | 4,765,150 | 4,765,150 | | | | | |
| **උප එකතුව** | | | | | | | | | | **4,765,150** | **4,765,150** | | | | | |
